# ජනාධිපතිවරණය 2015 සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මැදිහත්වීම පිළිබඳ වාර්තාව

2015

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

# ජනාධිපතිවරණය 2015 සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මැදිහත්වීම පිළිබඳ වාර්තාව

**2015**

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

පටුන | පිටුව


පටුන ii

පෙරවදන vi

හැඳින්වීම 1

මැතිවරණ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මැදිහත්වීම 2

2015 ජනාධිපතිවරණය 6

2015 ජනාධිපතිවරණයට අදාළව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මැදිහත්වීම: 7

මැතිවරණ කොමසාරිස්වරයා සමග පැවති විශේෂ සාකච්ඡාව - 2015.12.11 7

2015 ජනාධිපතිවරණයට අදාළව රැස්වීම් පැවැත්වීම සඳහා ස්ථාන වෙන් කිරීමේ ගැටළුව පිළිබඳ මැදිහත්වීම 9

2015 ජනාධිපතිවරණය සම්බන්ධයෙන් උතුරු මැද සහ නැගෙනහිර පළාතේ රාජ්‍ය නිලධාරීන් සහ පොලිස් නිලධාරීන් දැනුවත් කිරීම -2015.01.15 10

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු, තැපැල් දෙපාර්තමේන්තුව, ලංකා ගමනා ගමන මණ්ඩලය සහ මාර්ග සංවර්ධන අධිකාරිය සමග පැවැත්වූ සාකච්ඡාව 11

කම්කරු අමාත්‍යාංශයේ ලේකම්වරයා සමග විශේෂ සාකච්ඡාව 15

මැතිවරණ නිරීක්ෂණ සංවිධාන හා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සමග ක්‍රියාත්මක වන සිවිල් සංවිධාන උප කමිටු නියෝජිතයින් සමග සාකච්ඡාව 16

පෞද්ගලික අංශයේ නිවාඩු පිළිබඳව දෙවන සාකච්ඡාව - 2014.12.22 20

රාජ්‍ය නිලධාරීන් සහ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ ක්‍රියාත්මක වීම පිළිබඳ නියමය 21

සිරකරුවන් මැතිවරණ කටයුතු වලට යොදා ගැනීම පිළිබඳව කරුණු විමසීම – 2014.12.24 23

ආපදා තත්ත්වය සහ ඡන්දය භාවිතා කිරීමට අවස්ථාව ලබාදීම - 2015.01.05 24

දේශපාලන රැස්වීම් සඳහා පිට්ටනි ශාලා ලබා දීමේ අක්‍රමිකතා පිළිබඳ සාකච්ඡාව 26

මධ්‍යම සංස්කෘතික අරමුදල සිය කාර්ය මණ්ඩලය යාපහුවට කැඳවා ආයතනික වාර්ෂික සැලස්ම සාකච්ඡා කිරීමට ගෙන ඇති පියවර දේශපාලන පරමාර්ථයකින් සිදුකළ එකක් බවට නැගුණු චෝදනා පිළිබඳ සාකච්ඡාව 27

2015 ජනවාරි 08 පැවැත්වූ ජනාධිපතිවරණයට අදාළව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙහෙය වූ පැමිණිලි 29

2015.01.08 දින පැවති ජනාධිපතිවරණය අදාළව මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කරන ලද පැමිණිලි සම්බන්ධව ගන්නා ලද ක්‍රියා මාර්ග 30

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ඍජු මැදිහත්වීම් 40

ජනාධිපතිවරණය සම්බන්ධව පැෆරල් සංවිධානය මගින් යොමු කර තිබූ පැමිණිලි 44

මැතිරවණ දිනයේ පැවති තත්ත්වය අධීක්ෂණය කිරීම 48

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මේ සම්බන්ධයෙන් ඉදිරියේ දී අපේක්ෂිතමැදිහත්වීම් 50

මැතිවරණ දෙපාර්තමේන්තුව වෙත ලබාදෙන නිර්දේශයන් 53

සමාලෝචනය 54

## ඇමුණුම්

ඇමුණුම් 01 ඌව පළාත් මැතිවරණයෙන් අනතුරුව නිකුත් කළ මාධ්‍ය නිවේදනය

ඇමුණුම් 02 2014.12.04 දිනැතිව මැතිවරණ කොමසාරිස්වරයා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව එවන ලද ලිපිය

ඇමුණුම් 03 ශ්‍රී ලංකාවේ සියලුම පළාත්පාලන ආයතන වෙත ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මගින් යොමු කළ දැන්වීම

ඇමුණුම් 04 පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයින් සඳහා ජාතික මැතිවරණ වලදී වැටුප් හෝ පුද්ගලික නිවාඩු අහිමි වීමකින් තොරව ස්වකීය ඡන්දය දීමට හැකිවන පිනිස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මගින් කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කළ නිර්දේශය

ඇමුණුම් 05 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශයන් පදනම්ව කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යාංශය විසින් 2015 ජනවාරි 05 වන දින දිණමිණ, Daly News සහ තිනකරන් යන ජාතික පුවත්පත් තුනෙහි භාෂා තුනෙන්ම මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශය පදනම්ව වූ දැන්වීම්

ඇමුණුම් 06 මැතිවරණ වලදී රාජ්‍ය නිලධාරීන් සහ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ ක්‍රියාත්මක වීම පිළිබඳ නියමය

# පෙරවදන

ප්‍රාජාතන්ත්‍රවාදී සමාජයක ජීවත්වන පුරවැසියන්ට නිශ්චිත කාලසීමාවක් තුළ සිදුවන මැතිවරණ මගින් සිය පාලකයින් තෝරා පත් කර ගැනීමේ අවස්ථාව උදාවේ. එය පුරවැසියන්ගේ මතය නියෝජනය කිරීමට පාලනය සඳහා නියෝජිතයින් පත්කර යැවීමක් ලෙස දේශපාලන විද්‍යාව තුළ අර්තකථනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුවද මහා මැතිවරණ, පළාත් සභා මැතිවරණ, පළාත් පාලන ආයතන සභිකයින් තෝරා පත් කර ගැනීමේ මැතිවරණ, ජනමත විචාරණ සහ ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ මැතිවරණ සහ මැතිවරණ අවස්ථා කිහිපයදී තම ඡන්දය ප්‍රකාශ කර සිය පාලකයින් පත් කර ගැනීමේ හැකියාව පුරවැසියන්ට හිමිව ඇත.

2015 ජනවාරි මස 08 වන දින ශ්‍රී ලංකාවේ පුරවැසියන් තමන්ගේ ඡන්දයෙන් රටේ ප්‍රථම පුරවැසියා නැතහොත් ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ අවස්ථාව උදා විය. එම ක්‍රියාවලිය සිදුවන විට එය ඡන්ද දායකයින්ට කිසිදු බලපෑමකින් තොරව නිදහස් හා සාධාරණ ලෙස තම මතය ප්‍රකාශ කිරීමට අවස්ථාව හිමිවිය යුතු වූ අතර, එහිදී ඡන්දය මෙහෙය වන සහ ඊට සහාය ලබාදෙන රාජ්‍ය නිලධාරීන් කණ්ඩායම් වලටද කිසිදු බලපෑමකින් තොරව අපක්ෂපාතීව තම රාජකාරී ඉටු කිරීමේ අවස්ථාව ලබාදිය යුතුවේ.

මේ පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉතාමත් ඉහළ වැදගත්කමක් සහ වැඩි අවධානයක් යොමු කර වැඩි මැදිහත්වීමකින් කටයුතු කළ යුතු ජාතික වැදගත්කමකින් යුත් කාර්යයක් ලෙප එය හඳුනා ගන්නා ලදී. එහිදී රාජ්‍ය නිලධාරීන්ට අපක්ෂපාතිව කටයුතු කිරීමේ වටපිටාවක් සකස් කිරීම සඳහා නිර්දේශ සහ නියමයන් නිකුත් කිරීම

සිදුකරන ලදී. එමෙන්ම නිලධාරීන්ගේ ගැටලු පිළිබඳ සිවිල් සංවිධාන හා පුරවැසියන් ඉදිරිපත් කළ චෝදනා පිළිබඳ ක්ෂණිකව අදාළ පාර්ශවයන් ගෙන්වා විමසා බලා එම කටයුතු යථාවත් කිරීමට උපදෙස් ලබා දෙන ලදී. මෙම කටයුතු හුදෙක් පැමිණිල්ලක් කොමිෂන් සභාව වෙත ලැබෙන තෙක් බලා නොසිට මාධ්‍ය අධීක්ෂණය වැනි විකල්ප ක්‍රියා මාර්ග ගනිමින් වඩාත් අවධානයකින් පසුවෙමින් සිදුකරන ලදී.

මේ සියලුම දේ තුළින් මහජන මතය නිදහස්ව ප්‍රකාශ වීමටත් එය ඔස්සේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයේ ජීව ගුණය සුරක්ෂිත කිරීම තුළින් මූලික අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීමට සහ මානව හිමිකම් වටල ගරු කරන සමාජයක් නිර්මාණය කරගැනීමේ අරමුණු අනුව සිදුකරන ලදී.

# ජනාධිපතිවරණය 2015 සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මැදිහත්වීම පිළිබඳ වාර්තාව

## හැඳින්වීම

1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාව අනුව ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිවරයා රජයේ ප්‍රධානියා ද, විධායකයේ ප්‍රධානියා ද ආණ්ඩුවේ ප්‍රධානියා ද, සන්නද්ධ සේවාවන්හි සේනාධිනායකයා ද වන්නේ ය. ජනාධිපතිවරණය සය අවුරුදු කාලයක් සඳහා පත්කර ගනු ලැබේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ ප්‍රථම පුරවැසියා තෝරාගැනිම සඳහා ශ්‍රී ලංකාවේ ජනතාවට ලැබෙන අවස්ථාවක් ලෙස ජනාධිපතිවරණය සඳහන් කළ හැක. 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ 93 ව්‍යාවස්ථාව අනුව ජන්දය දීම නිදහස්ව ද, සමානව ද, රහසේ ද විය යුතු බව සඳහන් වේ. ජනාධිපතිවරයා තෝරාගැනීමේ ක්‍රියාවලිය 1981 අංක 15 දරණ ජනාධිපතිවරයා තෝරාපත් කරගැනීම පිළිබඳ පනත සහ ඊට පසුකාලීනව සිදුකළ පනත පදනම්වද සිදුකරනු ලැබේ. එහිදී 1988 අංක 16 දරණ පනත, 1988 අංක 31 දරණ පනත, 2004 අංක 14 දරණ පනත සහ 2011 අංක 28 දරණ පනත් ද මේ සඳහා අදාළ කරගනු ලබයි.

මෙම ක්‍රියාවලිය තුළ මැතිවරණ දෙපාර්තමේන්තුව පොලිස් දෙපාර්තමේන්තුව වෙත සුවිශේෂි කාර්යයක් පැවරී ඇත. එමෙන්ම එම කාර්යයන් පහසු කිරිම සඳහා තැපැල් දෙපාර්තමේන්තුව සහ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව ද ක්‍රියාත්මක වනු ලැබේ. එමෙන්ම සියලුම විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය ආයතනයන් වෙත ද ජනතා මතය සහ මැතිවරණය සඳහා ඉදිරිපත්ව සිටින අපේක්ෂකයින්ගේ අදහස් නිදහස්ව අපක්ෂපාතීව සහ සාධාරණ ලෙස ගලායාම සඳහා කටයුතු සකසා දිය යුතුව ඇත. තවද උක්ත ආයතනයන්හි ක්‍රියාකාරිත්වය වඩාත් දියුණු වටපිටාවක පවතින තත්වය තුළ සිවිල් සංවිධාන මෙම කටයුතු නිරීක්ෂණය

කරන තත්වයක් ද දක්නට ඇත. ඒ අනුව මැතිවරණ ක්‍රියාවලිය සිදුවන ආකාරයත් එහිදී රාජ්‍ය නිලධාරීන් සහ රට සම්බන්ධ සෙසු පාර්ශවයන්ගේ හැසිරීම ද මෙම මැතිවරණ නිරීක්ෂණ ක්‍රියාවලිය තුළට ඇතුළත් වේ. සිය කටයුතු වඩාත් අපක්ෂපාතීව සිදුකිරීම සඳහා ජාත්‍යන්තර නිරීක්ෂණ සංවිධාන වල සහාය ලබාගැනීමට ද මෙම සංවිධාන කටයුතු කරනු ලබයි.

රටේ පුරවැසියන්ගේ නිදහස් හා සාධාරණ මැතිවරණයක් මගින් සිය මැතිවරණ නියෝජිතයින් තෝරා ගැනීමේ ක්‍රියාවලිය සාධාරණව සිදුවන්නේ ද යන්න සොයා බැලීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මැදිහත්වීමක් සිදු කරයි. එම ක්‍රියාවලිය 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ බලතල ප්‍රකාරව සිදුකරන්නකි.

**මැතිවරණ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මැදිහත්වීම :**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත රට තුළ මූලික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමටත් මානව හිමිකම් ගරු කරන සංස්කෘතියක් රට තුළ නිර්මාණය කිරීම සඳහාත් සුවිශේෂී දායකත්වයක් ලබාදීමේ කාර්යභාරය පැවරී ඇත. ඒ අනුව පසුගිය 08 වන දින (2015 ජනවාරි මස 08 වන දින) පැවති මැතිවරණය සම්බන්ධයෙන් වඩාත් කැපී පෙනෙන දායකත්වයක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මගින් ලබාදෙන ලදී.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට රටතුළ මානව හිමිකම් ප්‍රවර්ධනය සහ සුරක්ෂිත කිරීමේ කාර්යභාරය ද පැවරේ. මෙහිදී කොමිෂන් සභාවට පෙනී ගියේ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක මහජන නියෝජිතයින් තෝරා ගැනීමේ ක්‍රියාවලිය මානව හිමිකම් ප්‍රවර්ධනය සහ සුරක්ෂිත කිරීමේ දී ඍජු සම්බන්ධතාවයක් පවතින බවයි. එසේම

මැතිවරණ නිදහස්ව සහ සාධාරණව පැවැත්වීම හා ඒ සඳහා සුදුසු පසුබිමක් පැවතීම ද මත තම නියෝජිතයින් තෝරාගැනීමේ ජනතා අභිලාෂයන් නිවැරදිව පිළිබිඹු වන බවයි. ඒ සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ද මැතිවරණ නීති හා අනෙකුත් නීති ද මගින් සුදුසු ප්‍රතිපාදන පවතී. ඒවා ප්‍රමාණවත් නොවූවද පවතින ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම තුල බොහෝ දුරට මැතිවරණ නිදහස් හා සාධාරණ කර ගැනීමේ අවස්ථාව පවතින බව ද කොමිෂන් සභාවේ අදහස වේ. මෙහි දී මෙකී නීති රීති ක්‍රියත්මක කිරීමේ දී රාජ්‍ය නිලධාරීන් අපක්ෂපාතීව සහ සාධාරණව ක්‍රියාත්මක වීම අවශ්‍ය වේ. දශක තුනක පමණ කාලවකවානුවක් තුල දේශපාලනීකරණය වූ රාජ්‍ය සේවයේ නිලධාරීන් එයින් මුදවා ගැනීමේ අවශ්‍යතාවය පැවතිණි. මේ නිසා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මැතිවරණයේ දී රාජ්‍ය නිලධාරීන්ගේ ක්‍රියාකාරිත්වය පවතින නීති රීති වලට අනුව සහ සාධාරණව සහ අපක්ෂපාතීව ඉටු වන බවට සහතික කර ගැනීම සඳහා ඔවුන්ගේ ක්‍රියා සම්බන්ධව නිරීක්ෂණ සහ මැදිහත් වීමේ ක්‍රියා මාර්ගයකට අවතීර්ණ වීමට තීරණය කරන ලදි. එහිදී ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන වගන්තිය ප්‍රකාරව නීතිය ඉදිරියේ සමානාත්මතාවය හා නීතිය ක්‍රියාත්මක කිරීම හා රැකවණය සර්ව සාධාරණ විය යුතුය යන්න හා දේශපාලන ආදී හේතු මත වෙනස් කමකට භාජනය නොකළ යුතුය යන විධි විධාන මේ සඳහා උපයෝගී කර ගන්නා ලදී. ඒ අනුව උතුරු පලාත් සභා මැතිවරණයේදී මැතිවරණ නිරීක්ෂණ කටයුතු වල යෙදුණු අතර අනෙකුත් පලාත් සභා මැතිවරණ වලදී නිරීක්ෂණ හා මැදිහත් වීම් කරමින් රාජ්‍ය නිලධාරීන් ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව මාර්ගෝපදේශ සකස් කර ත්‍රිභාෂාවෙන් ම නිකුත් කරන ලදි. ඌව පලාත් සභා මැතිවරණයේදී මැතිවරණ කොමසාරිස්වරයා ද ඇතුළුව ප්‍රාදේශීය ලේකම්වරු, පොලිස් ස්ථානාධිපතිවරුන්, ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් සහ නිරීක්ෂණ සංවිධාන කැඳවා මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී දැනුවත් කිරීමක් සිදු කරන ලදී. මෙය ඉතා ප්‍රයෝජනවත් එකක් වූ බව මැතිවරණ කොමසාරිස්වරයා ද ප්‍රකාශ කර ඇත. එම ක්‍රියාවලිය තවත් ඉදිරියට තබමින් 2015 ජනාධිපතිවරණයේ දී වැඩි මැදිහත් වීමක් සිදු කිරීමට කොමිෂන් සභාව කටයුතු කර ඇත.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මගින් 2014 වසර තුළ පුරවැසියන්ගේ සර්වජන ඡන්ද බලය සහ ඒ සඳහා අයහපත් ආකාරයෙන් බලපාන්නා වූ කරුණු පිළිබඳ අංශ කිහිපයක් ඔස්සේ මැදිහත්වීම් සිදුකර ඇත. ඒ අනුව:

01 බස්නාහිර සහ දකුණු පළාත් සභා මැතිවරණය ඉලක්ක කර පොලිස් නිලධාරීන් සහ ආරක්ෂක අංශවල නිලධාරීන් විසින් ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳ මාර්ගෝපදේශයක් නිකුත් කිරීම සහ එය පොත් පිංචක් ලෙස මුද්‍රණය කිරීම.

02 උක්ත මැතිවරණ දිනයේ දී පළාත් දෙක තුළ පිහිටි පරිපාලන දිස්ත්‍රික්ක 06 ක් ආවරණය වන පරිදි මැතිවරණ දින නිරීක්ෂණ කටයුතු සිදුකිරීම.

03 එම පළාත් දෙකේ නිරීක්ෂණයන් පදනම් ව කොමිෂන් සභාව විසින් මැතිවරණයේ දී ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් නිර්දේශ සංග්‍රහගත කිරීම සිදු කළ අතර එය පදනම් ව ඉදිරි මැතිවරණ වලදී ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සැලසුම් කරන ලදී.

04 2014 සැප්තැම්බර් මස පැවැත්වූ ඌව පළාත් සභා මැතිවරණය පිළිබඳ මැතිවරණ කොමසාරිස්වරයාගේ සහභාගිත්වය සහිතව මොණරාගල දිස්ත්‍රික්කයේ සියලු පොලිස් අධිකාරීවරු, පොලිස් ස්ථානාධිපතිවරුන්, ගමනාගමන මණ්ඩල ප්‍රධානීන් සහ මධ්‍යම පරිසර අධිකාරිය සම්බන්ධ පළාත් නිලධාරීන් මැතිවරණයේදී ක්‍රියාත්මක විය යුතු ආකාරය දැනුවත් කිරීම.

05 මැතිවරණ පොදු නිර්දේශ සහ මාර්ගෝපදේශ මුද්‍රණය කර එළිදැක්වීම මෙම නිර්දේශයන් කොමිෂන් සභාව 2014 බස්නාහිර සහ දකුණු පළාත් මැතිවරණ නිරීක්ෂණ වලදී හඳුනාගත් කරුණු මත පදනම්ව එළිදැක්වීම සිදුකරන ලදී.

**06** මැතිවරණය පැවති දින සහ පසු දින ඌව පළාත තුළ පළාතේ සියලුම පරිපාලන දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම් 04ක් නිරීක්ෂණ කටයුතු සිදුකිරීම.

**07** ඌව පළාත් සභා මැතිවරණයේ දී බදුල්ල දිස්ත්‍රික්කයේ මැතිවරණ නිරීක්ෂණ කටයුතු වල සම්බන්ධ වූ කණ්ඩායම් පශ්චාත් මැතිවරණ නිරීක්ෂණ කටයුතු වලින් අනතුරුව ආපසු කොළඹ බලා පැමිණීමේ දී මාරක රිය අනතුරක ලක් වූ අතර එහි දී ඌව පළාත් නිරීෂණ කණ්ඩායම් භාරව ක්‍රියා කළ කොමිෂන් සභාවේ අධීක්ෂණ සහ සමාලෝචන අංශයේ අධ්‍යක්ෂිකා තුසිතා සමරසේකර මෙනවිය මරණයට පත් විය. එමෙන්ම එම කටයුතු වල නිරත වූ නිලධාරීන් දෙදෙනාට ද බලපතල තුවාල සිදු විය.

එකී ක්‍රියාත්මකවීම නිසා මැතිවරණයේ දී පොලිස් නිලධාරීන්ට සහ මැතිවරණ කොමසාරිස්වරයාට සිය කටයුතු කරගෙන යාමේ දී විශාල රුකුලක් ලැබුණු බව මැතිවරණ කොමසාරිස්වරයා ඌව පළාත් මැතිවරණයෙන් අනතුරුව නිකුත් කළ මාධ්‍ය නිවේදනය මගින් කරුණු දක්වා ඇත. එමෙන්ම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සමග ක්‍රියාත්මක වන සිවිල් සංවිධාන උප කමිටුව ද මානව හිමිකම් කොමිෂන් සභාව මැතිවරණ ක්‍රියාවලිය තුළ මැදිහත්වීම මගින් රට තුළ ස්වාධීන හා නිදහස් මැතිවරණයක් සඳහා වඩාත් විශාල දායකත්වයක් ලබාදියහැකි බව ප්‍රකාශ කරන ලදි( ඇමුණුම් 01 බලන්න) .

## 2015 ජනාධිපතිවරණය

2014 නොවැම්බර් මස 20 වන දින අංක : 1889/31 අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 වන ව්‍යවස්ථාවේ (3අ) අනු ව්‍යවස්ථාවේ ජනාධිපතිවරණයෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව වැඩිදුර කාලයක් සඳහා ඔහුව පත් කර ගැනීමෙන් ධූරය දැරීම පිණිස එමෙන්ම ලබාගැනීම සඳහා ජනතාව වෙත ආයාචනා කිරීමේ අභිලාෂය ප්‍රකාශ කරන ලදි. ඒ අනුව මැතිවරණ කොමසාරිස්වරයා 1981 අංක 15 දරණ ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ පනතේ 2 වන වගන්තිය ප්‍රකාරව 2014 නොවැම්බර් 21 දින අංක : 1889/35 ලෙස අතිවිශේෂ ගැසට් පත්‍රයක් පළ කරන ලදි. එමගින් 2014 දෙසැම්බර් මස 08 වන දිනය ජනාධිපතිවරණයේ තෝරා පත් කරගැනීම සඳහා අපේක්ෂකයින්ගේ නාමයෝජනා දිනය ලෙස ද 2015 ජනවාරි මස 08 වන දින ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීම පවත්වන දිනය ලෙස ද නියම කරන ලදි. 2014 නොවැම්බර් මස 21 වන දිනම අංක : 1886/36 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් මැතිවරණ කොට්ඨාස 22ක් සඳහා තේරීම්භාර නිලධාරීන් සහ එම මැතිවරණ කොට්ඨාස 22 සඳහා සහකාර තේරීම්භාර නිලධාරීන් ද පත්කිරීම් සිදුවිය. 2014 නොවැම්බර් මස 24 වන දින අංක 1890/2 අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් 2015 ජනවාරි මස 08 දින පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණය පිළිබඳව විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය විසින් පිළිපැදියයුතු උපමාන එළිදක්වන ලදි. මෙය උක්ත මැතිවරණය අවසාන වනතෙක් පිළිපදින ලෙස මැතිවරණ කොමසාරිස්වරයා සියලුම මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය පාලනාධිකාරීන් වෙතින් කාරුණිකව ඉල්ලා සිටින ලදි.

2014.12.08 වන දින 2015 ජනාධිපතිවරණයට අදාළව නාමයෝජනා භාරගැනීම සිදුවිය. මෙම මැතිවරණය සඳහා පිළිගත් දේශපාලන පක්ෂ වලින් අපේක්ෂකයින් 17ක් ද ස්වාධීන කණ්ඩායම් වලින් අපේක්ෂකයින් 02ක් ද ඉදිරිපත් වූ අතර මැතිවරණය 2015 ජනවාරි මස

08 වන දින උක්ත අපේක්ෂකයින් 19 දෙනාගෙන් සහභාගීත්වයෙන් සිදුවන බව 2014.12.08 දිනැතිව නිකුත් කළ අංක :1892/8 අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශ කරන ලදි.

2014.12.04 දිනැතිව මැතිවරණ කොමසාරිස්වරයා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසන් සභාව වෙත ලිපියක් නිකුත් කරමින් පසුගිය ඌව පළාත් සභා මැතිවරණයේදී මැතිවරණය නිදහස්, සාධාරණ හා අපක්ෂපාතී භාවය වෙනුවෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසන් සභාව සිදු කළ ආකාරයේ දීපව්‍යාප්ත මැදිහත්වීමක් පිළිබඳ ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. ( ඇමුණුම් 02 බලන්න)

## 2015 ජනාධිපතිවරණයට අදාලව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මැදිහත්වීම :

### මැතිවරණ කොමසාරිස්වරයා සමග පැවති විශේෂ සාකච්ජාව 2015.12.11 :

මෙම මැතිවරණය නිදහස්ව, සාධාරණව සහ අපක්ෂපාතිව සිදු කිරීම සඳහා රට දායක වන සියළු පාර්ශවයන් සමග කටයුතු කරමින් ක්‍රියා කළ යුතුය යන්න කොමිෂන් සභාවේ අදහස විය. මැතිවරණය සම්බන්ධව සිදුවන ගැටළුකාරී තත්ත්වයන් සහ සාධාරණයට හානිවීමේ තත්ත්වයන් පාලනය කිරීමේ සහ නියාමනය කිරීමේ හැකියාවක් පොලිසියට සහ මැතිවරණ දෙපාර්තමේන්තුව සතුව පවතී. ඒ අනුව 2014 දෙසැම්බර් 02 වන දින 2015 ජනාධිපතිවරණය පිළිබඳ විශේෂ සාකච්ජාවක් සඳහා පොලිස්පතිතුමා, මැතිවරණ කොමසාරිස්තුමා සහ පොලිස් දෙපාර්තමේන්තු පාලනය කරනු ලබන නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්වරයාට ඇරයුම් කරන ලදි. එහිදී පොලිස්පතිවරයා නියෝජනය කරමින් පොලිස් මැතිවරණ සහ පරිපාලන කටයුතු භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා ද පොලිස් නීති අංශය වෙතින් නියෝජ්‍ය පොලිස්පතිවරයා ද සහභාගී වූ

අතර, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙනුවෙන් එම අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙකු සහභාගී විය. මැතිවරණ දෙපාර්තමේන්තුව නියෝජනය කලේ මැතිවරණ කොමසාරිස්වරයා සහ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරයා ය.

මෙම සාකච්ඡාවේදී මූලිකවම මැතිවරණ ක්‍රියාවලිය සාධාරණව සිදුවීමට සෙසු සහාය ආයතන සහ අනෙකුත් සම්බන්ධතා ආයතන වල කටයුතු නියාමනය කිරීම පිළිබඳව අවධානය යොමු කරන ලදි. එහිදී මැතිවරණ කොමසාරිස්වරයා 2014 ඌව මැතිවරණය ඇතුළු පසුගිය මැතිවරණ වලදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ජනතාවට නිදහස් හා සාධාරණ මැතිවරණයක් ලබාදීමට ඇති අයිතිය තහවුරු කිරීමට ගත් පියවර ඇගයුමට ලක් කලේ ය. මැතිවරණ නාමයෝජනා ලබාදීමට පෙර සිටම මැතිවරණයට ඉදිරිපත්වීමට සූදානම් වන පුද්ගලයින්ගේ රූප ඇතුළත් විශාල පුවරු ප්‍රදර්ශනය වීමට පටන්ගෙන ඇති බවත් ඒවා ඉවත්කිරීමේ කටයුතු පොලිස් දෙපාර්තමේන්තුව ආරම්භ කර ඇති බවත් පොලිසිය නියෝජනය කරමින් පැමිණි නියෝජ්‍ය පොලිස්පතිවරයා ප්‍රකාශ කරන ලදි. මෙම කටයුතු සිදු කිරීමට යොදාගැනීම සඳහා අවශ්‍ය කරන්නාවූ කම්කරුවන් පොලිසිය වෙත ලැබී ඇති බව ද වැඩිදුරටත් ප්‍රකාශ විය. එසේම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් බස්රථ සහ අධිවේගී මාර්ගයේ ගමන් ගන්නා බස් රථවල පෝස්ටර් ප්‍රදර්ශනය කර ඇති බවත් ඒ සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරිය ද වගකිවයුතු බව මැතිවරණ කොමසාරිස්වරයා විසින් අවධාරණය කරන ලදි. එමෙන්ම ඡන්ද කාඩ්පත් මුද්‍රණය කිරීම පිළිබඳව පවතින තත්ත්වය සහ නිල ඡන්ද පත්‍රිකා බෙදාදීමේ කටයුතු සිදුවන ආකාරය පිළිබඳව කොමිෂන් සභාව ඉදිරියේ කරන විමසීම වඩාත් සුදුසු බව මැතිවරණ කොමසාරිස්වරයාගේ අදහස විය. ඒ අනුව මැතිවරණ දෙපාර්තමේන්තුව, පොලිස් දෙපාර්තමේන්තුව, ලංකා ගමනා ගමන මණ්ඩලය, මාර්ග සංවර්ධන අධිකාරිය, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව සහ තැපැල් දෙපාර්තමේන්තුව කොමිෂන් සභාව ඉදිරියට කැඳවීමට තීරණයක් ගන්නා ලදි.

එසේම වඩාත් ගැටළුකාරී තත්ත්වයන් ඇතිවිය හැකි බවට අනුමාන කරන හා වඩාත් සංවේදී ප්‍රදේශ සඳහා විශේෂ ආරක්‍ෂක වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන බව ද පොලිස් දෙපාර්තමේන්තුවේ නියෝජිතයින්ගෙන් ප්‍රකාශ විය.

මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා ක්‍රීඩාපිටි, බස්නැවතුම්පල, පොදු රැස්වීම් ශාලා වෙන් කර ගැනීමේදී බලය පවතින පක්‍ෂයෙන් ප්‍රතිපක්‍ෂ කණ්ඩායම් වලට යම් යම් ගැටළුකාරී තත්ත්වයන් වාර්තා වී ඇති බව මැතිවරණ කොමසාරිස්වරයා ප්‍රකාශ කරන ලද අතර ඒ අනුව ඒ පිළිබඳ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මැදිහත්වීම එහිදී අවශ්‍ය වන බව ද මැතිවරණ කොමසාරිස්වරයාගේ ඉල්ලීම විය. ඒ අනුව කොමිෂන් සභාව මේ පිළිබඳව සොයා බලා උක්ත ස්ථානයන්හි පාලනය පවත්නා පළාත් පාලන ආයතන ඒ පිළිබඳව දැනුවත් කිරීමට තීරණය කරන ලදි. මෙම රැස්වීම් පැවැත්වීමෙන් අනතුරුව මෙම රැස්වීම පිළිබඳව සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 2015 ජනාධිපතිවරණය සම්බන්ධයෙන් ක්‍රියාත්මක බව ප්‍රකාශ කරමින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා අන්තර්ජාල පිටුවට 2014 දෙසැම්බර් 15 වන දින ප්‍රවෘත්තියක් පළ කරන ලදි[1].

**2015 ජනාධිපතිවරණයට අදාළව රැස්වීම් පැවැත්වීම සඳහා ස්ථාන වෙන් කිරීමේ ගැටළුව පිළිබඳ මැදිහත්වීම :**

2014.12.11 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ පැවැත්වූ රැස්වීමේදී මතුවූ ගැටළුකාරී තත්ත්වය පිළිබඳව ඊට පසු දින එනම් 2014.12.12 වන දින කොමිෂන් සභාව ප්‍රතිචාර දක්වන ලදි. ඒ අනුව සිංහල, දෙමළ සහ ඉංග්‍රිසි යන භාෂා තුනෙන් සකස් කරන ලද දැන්වීමක් ශ්‍රී ලංකාවේ සියලුම පළාත්පාලන ආයතන වෙත ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මගින් යොමු කරන ලදි. එම දැන්වීම තුළ රාජකාරී ඉටු කිරීමේදී රාජ්‍ය

[1] http://hrcsl.lk/english/?p=2458

නිලධාරීන් ලෙස නිත්‍යානුකූලව හා සාධාරණව කටයුතු කිරීමට බැඳී ඇති බවත් ජනාධිපතිවරණයට අදාළ අපේක්ෂකයන් වෙනුවෙන් පවත්නා ප්‍රචාරක රැස්වීම් සඳහා ස්ථාන වෙන් කිරීමේදී යම් යම් පාර්ශවයන් පක්ෂපාතීව සහ තවත් පාර්ශවයන් අගතියට පත්වන ආකාරයට ක්‍රියාත්මක කිරීම් නොකරන ලෙසත් දන්වන ලදී. එලෙස පක්ෂපාතී ලෙස ක්‍රියාත්මක වන්නේ නම් එය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනයක් බව ද අවධාරණය කර ලදී. මහ නගර සභා 23ක්, නගර සභා 41 ක් සහ ප්‍රාදේශීය සභා 272ක් වෙත මෙම දැන්වීම භාෂා තුනෙන් යොමු කරන ලදී. ඉන් අනතුරුව 2014 දෙසැම්බර් මස 17 වන දින උක්ත දැන්වීම සම්බන්ධ ප්‍රවෘත්තියක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා අන්තර්ජාල පිටුවේ පළකළ අතර උක්ත ත්‍රිභාෂා දැන්වීම ඒ ඔස්සේ බාගත කිරීමේ පහසුවද සලසන ලදී[2]. මෙම පළ කිරීම් සිදු කරනවාත් සමගම එම ප්‍රවෘත්තිය ශ්‍රී ලංකාවේ සහ ශ්‍රී ලංකාවෙන් පිටත සිට ක්‍රියාත්මක වන ප්‍රවෘත්ති අන්තර්ජාල පිටු රැසක එය ප්‍රවෘත්තියක් ලෙස පළ කරමින් විශාල ප්‍රසිද්ධියක් ලබා දී තිබුණි( ඇමුණුම් 03 බලන්න) .

**2015 ජනාධිපතිවරණය සම්බන්ධයෙන් උතුරු මැද සහ නැගෙනහිර පළාතේ රාජ්‍ය නිලධාරීන් සහ පොලිස් නිලධාරීන් දැනුවත් කිරීම (2015.01.15):**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපති හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ප්‍රියන්ත ආර්.පී. පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් හා කොමසාරිස් ටී.ඒ. ආනන්දරාජා, කොමසාරිස් ආචාර්ය ප්‍රතිභා මහානාමහේවා, ලේකම් සමන්ති ජයමාන්න හා නීති ලේකම් නිමල් ජී පුංචිහේවා යන මහත්ම මහත්මීන්ගේ සහභාගිත්වයේන උක්ත රැස්වීම පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී සිදුකරන ලදී. මේ සඳහා මැතිවරණ

[2] http://hrcsl.lk/english/?p=2465

කොමසාරිස් මහින්ද දේශප්‍රිය මහතා මැතිවරණ දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් සහභාගී වූ අතර දිස්ත්‍රික් ලේකම්වරු ඇතුළු උතුරු මැද පළාතේ සහ නැගෙනහිර පළාතේ රාජ්‍ය නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් ඇතුළු පොලිස් නිලධාරීන් 100 කට අධික පිරිසක් මේ සඳහා කැඳවා තිබිණි. මෙහිදී අනුරාධපුර, පොළොන්නරුව, අම්පාර, මඩකලපුව (කල්මුණේ) සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක වල පොලිස් ස්ථානාධිපතිවරුන් ඇතුළුව අනුරාධපුර පොළොන්නරුව දිස්ත්‍රික්ක වල අනෙකුත් රාජ්‍ය නිලධාරීන්ගේ ද සහභාගිත්වය කැපී පෙනේ. මෙම නිලධාරීන් මැතිවරණයේ දී වගකීම් දරණ සහ එකී කටයුතු වලට සම්බන්ධ නිලධාරීන් වන අතර ඒ වන විට අදාළ පළාත් දෙක තුළ මැතිවරණ සංවිධාන තත්ත්වය සහ එම කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී පවතින අභියෝග මෙහිදී සාකච්ඡාවට බඳුන් විය. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මගින් ප්‍රකශයට පත් කළ මැතිවරණ මාර්ගෝපදේශ සහ නිර්දේශ පිළිබඳ මෙහිදී නිලධාරීන්ට කරුණු පැහැදිලි කිරීමක් සිදුකළ අතර ඒ අනුව නිදහස් හා සාධාරණ මැතිවරණයක් වෙනුවෙන් රාජ්‍ය නිලධාරීන් ක්‍රියාත්මක වියයුත්තේ කෙසේද යන්නත් එය රටේ ප්‍රජාතන්ත්‍රවාදී පරිසරය ශක්තිමත් කිරීමට සිදුකරන දායකත්වය පිළිබඳවත් වැඩිදුරයත් කරුණු පැහැදිලි කරදීම සිදුකරන ලදී.

**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු, තැපැල් දෙපාර්තමේන්තුව, ලංකා ගමනා ගමන මණ්ඩලය සහ මාර්ග සංවර්ධන අධිකාරිය සමග පැවැත්වූ සාකච්ජාව :**

2014 දෙසැම්බර් මස 18 වන දින මෙම සාකච්ජාව පවත්වන ලදී. ඒ සඳහා මැතිවරණ කොමසාරිස් මහින්ද දේශප්‍රිය මහතා, මැතිවරණ කටයුතු භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, නීති අංශය භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, ගමනාගමන මණ්ඩලයේ සභාපති, අතිරේක මුද්‍රණාලයාධිපති, මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්, තැපැල්පති, නියෝජ්‍ය තැපැල්පති සහ මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා සහභාගී

විය. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිතුමා සාකච්ජාවේ මූලසුන ගනු ලැබීය. තැපැල් දෙපාර්තමේන්තුවේ කටයුතු පිළිබඳ මූලින් පවසන ලදි. නිල ඡන්ද පත්‍රිකා ලියාපදිංචි තැපෑලෙන් බෙදන අතර නිවැසියන්ගේ අත්සන් ද බෙදා දීමේදී ගනු ලැබේ. නාගරික ප්‍රදේශවල ඉරිදා දිනයන් ද යොදා මෙම කටයුතු සිදු කරන බව තැපැල්පතිවරයා ප්‍රකාශ කරන ලදි. විපක්ෂ ක්‍රියාකාරින්ට නිල ඡන්ද පත්‍රිකා බෙදාදීම නොකරන බවට චෝදනා පවතින බව මැතිවරණ කොමසාරිස්වරයා ප්‍රකාශ කරන ලද අතර, ඔහු වැඩිදුරටත් සඳහන් කළේ නිල ඡන්ද පත්‍රිකා ඡන්දය දැමීමට අත්‍යාවශ්‍ය නොවන නමුත් එය තිබීම කටයුතු ඉක්මන් කිරීමට හේතු වන බවයි. එමෙන්ම අවිස්සාවේල්ල, ඉමදූව සහ මදුරන්කුලිය තැපැල් කාර්යාල විවෘත කිරීමට කටයුතු පවතින බවට තොරතුරු ඇති බව මැතිවරණ කොමසාරිස්වරයා ප්‍රකාශ කරමින් එය දේශපාලන මුහුණුවරක් ගැනීමට ඉඩ පවතින බවද වැඩිදුරටත් සඳහන් කරන ලදි. එහිදී කරුණු දැක්වූ මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිතුමා සඳහන් කළේ එම කටයුතු වලින් දේශපාලන වාසි ලබාගැනීමට අවස්ථාවක් ලබා නොදෙන ලෙසයි. එයට ප්‍රතිචාර දැක්වූ තැපැල්පතිවරයා සඳහන් කළේ එම විවෘත කිරීම් ඡන්දයෙන් පසු දිනයකට යොදා ගන්නා බවත් වැඩ කඩිනමින් කිරීමට ඉරිදා දිනයන් ද යොදා ගන්නා බවත් ය. තැපැල්පතිතුමාගේ ඉල්ලීම මත නිල ඡන්ද පත්‍රිකා බෙදා දීම් කටයුතු වලට පූර්ණ පොලිස් ආරක්ෂාවක් ලබාදීමට පොලිස් දෙපාර්තමේන්තුවේ නියෝජිතයින් එකග විය. කොම්පඤ්ඤවීදිය ප්‍රදේශයේ පදිංචිව සිටින පුද්ගලයින්ට එම ප්‍රදේශයට ඡන්දය භාවිතා කිරීමට ඉඩ ලබාදියයුතු බවට ශ්‍රේෂ්ඨාධිකරණය මැතිවරණ කොමසාරිස්වරයා වෙත නියෝගයක් නිකුත් කර ඇත. ඒ අනුව අදාල පුද්ගලයින්ගේ නිල ඡන්ද පත්‍රිකා ඔවුන්ගේ කලින් ලිපිනයන්ට අදාල තැපැල් කාර්යාල වල තබා ඇති බව තැපැල්පති සඳහන් කරන ලදි. තමන් එම පුද්ගලයින් දැනට පදිංචිව සිටින්නේ කොහේද යන්න නොදන්නා බව ද සඳහන් කරන ලදි.

ලංකා ගමනාගමන මණ්ඩලය සම්බන්ධයෙන් විශාල ලෙස චෝදනා තිබෙන බව මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිවරයා ප්‍රකාශ කරන ලදි. ඒ සම්බන්ධයෙන් ලංකා

ගමනාගමන මණ්ඩලයේ සභාපතිවරයා කරුණු දක්වන ලදි. අධිවේගී මාර්ගය ඔස්සේ මැතිවරණ ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය වන බවට ඉදිරිපත් වූ කරුණු පිළිබඳව අදහස් දැක්වූ ලංගම සභාපතිවරයා ඒ පිළිබඳ පෞද්ගලිකව සොයා බලන බවට ද එකග විය. නොමිලයේ බස් රථ ජනාධිපතිවරණයේ ප්‍රචාරක රුස්වීම් වලට ලබාදෙන බවට වූ චෝදනා පිළිබඳව අදහස් දැක්වූ සභාපතිවරයා තමන් මුදල් අය කර ගැනිමේ පදනම මත පමණක් බස් රථ නිකුත් කරන බවත් විරුද්ධ පක්ෂ වලට වුවද මුදල් ගෙවීමේ පදනම මත බස් රථ ලබාගතහැකි බවත් සදහන් කරන ලදි. අනුරාධපුරයේ පැවති රුස්වීමට අදාලව ලංගම වෙත රුපියල් මිලියන 25ක් බැර කර බස් රථ ලබාදුන් බව මෙහිදී සදහන් කරන ලදි. මෙම බස්රථ ලබාදීම මගින් ප්‍රදේශයේ සාමාන්‍ය ගමනාගමනයට බලපෑම් වූ බවට චෝදනාව සම්බන්ධයෙන් සභාපතිවරයාට පැහැදිලි පිළිතුරක් ලබාදීමට හැකිවූයේ නැත. සිසුසැරිය බස්රථ එලෙස ධාවනයට යොදා තිබුණු බව ඔහු වැඩිදුරටත් සදහන් කරන ලදි. ගමනාගමන මණ්ඩලය තුළ සියළුදෙනාටම නිදහස්ව කටයුතු කිරීමට ඉඩ ලබාදී ඇති බවත් එවකට බලයේ සිටි රජයට සම්බන්ධ වෘත්තිය සමිතියක් සේවකයන්ට බලපෑම් කරන බවට එල්ලවූ චෝදනාවට ඔහු පිළිතුරු ලෙස සදහන් කළේ එවැනි බලපෑමක් ආයතනය තුළ වීමට ඉඩ ලබා නොදෙන බවයි.

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරීත්වය පිළිබඳව මීලගට විමසා බලන ලදි. එහිදී රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව මැතිවරණ කටයුතු විශේෂ කාර්යයක් ලෙස සළකා කටයුතු කරයි. එසේම පලපුරුද්ද නොමැති පුද්ගලයින් මෙම කටයුතු වලට යොදාගෙන ඇතැයි නැගෙන චෝදනා ප්‍රතික්ෂේප කරන බව අතිරේක මුද්‍රණාලයාධිපති වරයා සදහන් කරන ලදි. එමෙන්ම රජයට සම්බන්ධ දේශපාලන කටයුතු වලට තම දෙපාර්තමේන්තුව යොදා ගැනීමට ඉඩකඩ නොමැති බවද වැඩිදුරටත් සදහන් කරන ලදි. මැතිවරණයට අදාළ සියලු මුද්‍රණ කටයුතු රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව හරහා පමණක් සිදුවන බව මැතිවරණ කොමසාරිවරයා තවදුරටත් පෙන්වා දෙන ලදි.

මාර්ග සංවර්ධන අධිකාරිය මැතිවරණය සම්බන්ධයෙන් නැගෙන චෝදනා මීලගට විමසා බලන ලදි. මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයින් 12,000 පමණ වන අතර, ඒ අතර හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් සේවයට පැමිණි සේවකයින් ද ඇත. එම පිරිස මහින්ද රාජපක්ෂ මහතාට දිනවන සේ වැඩ කරනවා වියහැක. එය මාර්ග සංවර්ධන අධිකාරියේ මැදිහත්වීමෙන් වන දෙයක් නොවේ. පුද්ගලිකව අධිවේගී මාර්ගයේ සවිකර ඇති මැතිවරණ ප්‍රචාරක පුවරු පිළිබඳව සොයා බලනවා. අධිවේගී මාර්ගයේ පිටස්තර අයට පැමිණ එවැනි සවිකිරීමක් කිරීමට හැකියාවක් නොමැති බවට සභාවෙන් අදහසක් මතු විය. මහාමාර්ගය හරහා තොරන් ඉදි කිරීම පිළිබඳ මාර්ග සංවර්ධන අධිකාරියේ වගකීම පිළිබඳව මෙහිදී පොලිස් නියෝජිතයින් අදහස් ඉදිරිපත් කරන ලදි. එමෙන්ම මෙම ප්‍රචාරක පුවරු වෙනුවෙන් පළාත් පාලන ආයතන බදු මුදල් අයකර නොමැති බවද පොලිස් නියෝජිතයින් සඳහන් කරන ලදි. උක්ත කරුණු වලට අමතරව මෙම සාකච්ඡාවේදී තවත් ප්‍රධාන කරුණු තුනක් පිළිබඳව මැතිවරණ කොමසාරිස්වරයා සහ පැමිණි නියෝජිතයින්ගෙන් මතුවිය.

1. සිරකරුවන් මැතිවරණ ප්‍රචාරක කටයුතු වලට යොදා ගත් බව පුවත්පත් මගින් සිදුකර ඇති වාර්තා පිළිබඳව සොයා බැලීම.
2. සෞඛ්‍ය කාර්ය මණ්ඩලවල සේවා අවශ්‍යතා නිසා නිවාඩු ලබාගැනීමට අපහසු කණ්ඩායම් වලට ඡන්දය භාවිතා කළහැකි වන ලෙස නීතිය වෙනස් වීම.
3. පෞද්ගලික අංශයේ සේවා නියුක්තකයින්හට සිය ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා නිවාඩු ලබාදීමේ නිසි ක්‍රමවේදයක් නොමැතිවීම.

උක්ත කරුණු තුන ඇසුරෙන් සිරකරුවන් සහ පෞද්ගලික අංශයේ නිවාඩු පිළිබඳව කඩිනමින් අදාළ පාර්ශවයන් කැඳවා විමසා බැලීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිතුමා විසින් දැන්වීමක් සිදුකරන ලදි. ඒ අනුව කම්කරු අමාත්‍යාංශයේ

ලේකම්වරයා සහ කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු කොමසාරිස් ජනරාල්වරයා හෙට දින (2014.12.19) කැඳවීමට කටයුතු කරන බව ද දන්වන ලදි.

## කම්කරු අමාත්‍යාංශයේ ලේකම්වරයා සමග විශේෂ සාකච්ජාව

මෙම සාකච්ජාව 2014.12.19 වන දින පවත්වන ලද අතර ඊට කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යාංශයේ ලේකම්, කම්කරු දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා සහභාගී විය. එහිදී මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිතුමා කම්කරු අමාත්‍යාංශයේ ලේකම්වයා වෙත දන්වා සිටියේ පෞද්ගලික අංශයේ සේවකයින්හට ඡන්දය ප්‍රකාශ කිරීමට ප්‍රමාණවත් තරම් නිවාඩු නොලැබෙන බව පැමිණිලි ලැබී ඇති බවයි. එහිදී කරුණු ඉදිරිපත් කළ කම්කරු කොමසාරිස්වරයා ප්‍රකාශ කලේ මැතිවරණ පනත අනුව දැක්වෙන ලෙස ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබාදෙන ලෙස සෑම මැතිවරණයකදීම පුවත්පත් දැන්වීමක් මගින් සේවා යෝජකයින් දැනුවත් කරන බවයි. මෙහි වැඩි බලයක් ඇත්තේ මැතිවරණ කොමසාරිස්වරයාට බව කම්කරු අමාත්‍යාංශයේ ලේකම්වරයා ප්‍රකාශ කරන ලදි. එමෙන්ම අදාළ නියමයන් උල්ලංඝණය කළහොත්, මැතිවරණයෙන් අනතුරුව මැතිවරණ කොමසාරිස්වරයා හරහා ඉදිරි නීතිමය පියවර ගතහැකි බවත් ප්‍රකාශ කළේ ය. දිස්ත්‍රික් කම්කරු කාර්යාලවල නිලධාරීන් මැතිවරණ කොමසාරිස්වරයා විසින් මෙම කරුණු පිළිබඳව නිසි බලධාරීන් ලෙස පත් කරන්නේ නම් මෙම කාර්යයන් වඩාත් පහසු වනු ඇතැයි යන්න අදහසක් ලෙස ඉදිරිපත් විය. අනෙක් අතට නිවාඩු ලබා නොදුන් සේවා යෝජකයින් පිළිබඳ පසු සොයා බැලීමක් සිදු නොවන බව ද මැතිවරණයෙන් පසු එය අමතක කර දමන බවට ද කරුණු ඉදිරිපත් විය.. මැතිවරණයෙන් පසුව එය අමතක කර නොදමා අධිකරණ ක්‍රියාමාර්ග ගන්නේ නම් මෙම තත්ත්වය වෙනස් කිරීම කළහැකි බවද ලේකම්වරයා වැඩිදුරටත් සඳහන් කරන ලදි. මැතිවරණ පනත තුළ පවතින නිවාඩු ලබාදීම යන්න වඩාත් ශක්තිමත් කිරීම සඳහා ඊට සංශෝධන ඇතිවිය යුතු බව ද කරුණු ඉදිරිපත් විය. කම්කරු අමාත්‍යවරයා මැතිවරණයකදී පෞද්ගලික අංශයේ සේවා යෝජකයින් වෙත

ඔවුන්ගේ සේවා නියුක්තිකයින්ට සිය ඡන්දය භාවිතා කිරීම සඳහා නිවාඩු ලබා දීමට ඉල්ලීමක් ලෙස නොව රැට වඩා බලවත් ලෙස ඉදිරිපත් කිරීමේ වැදගත්කම මෙහිදී මානව හිමිකම් කොමිෂන් සභාව පෙන්වා දෙන ලදි. මෙම සාකච්ඡාව සඳහා මැතිවරණ කොමසාරිස්වරයා නියෝජිතයෙකු අද දින සහභාගී කර නොමැති බැවින් මෙම සාකච්ඡාව 2014.12.22 දිනට නැවත පැවැත්වීමට තීරණය කරන ලදි.

**මැතිවරණ නිරීක්ෂණ සංවිධාන හා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සමග ක්‍රියාත්මක වන සිවිල් සංවිධාන උප කමිටු නියෝජිතයින් සමග සාකච්ඡාව :**

මෙම සාකච්ඡාව 2014.12.19 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිතුමාගේ මූලිකත්වයෙන් ආරම්භ කරන ලදි. ඒ සඳහා නියෝජිතයින් 10 දෙනෙකු සහභාගී විය.

- මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය
- නිදහස් හා සාධාරණ මැතිවරණ සඳහා ජනතා ව්‍යාපාරය
- ට්‍රාන්ස් පේරන්සි ශ්‍රී ලංකා ආයතනය
- ජාතික මැතිවරණ මධ්‍යස්ථානය
- නිදහස් හා සාධාරණ මැතිවරණ සඳහා වූ ජනතා ක්‍රියාකාරීන්
- ලක්බිමේ මව්වරු සහ දියණියෝ
- නිදහස් හා සාධාරණ මැතිවරණ සඳහා වූ ව්‍යාපෘතිය

යන මැතිවරණ නිරීක්ෂණ සංවිධාන නියෝජිතයින් සහ Inform ආයතනය නියෝජනය කරමින් නියෝජිතයෙකු මෙම සාකච්ඡාවට සහභාගී විය. 2014.12.18 වන දින පවත්වන ලද රැස්වීම පිළිබඳ සමාලෝචනයක් නීති ලේකම්තුමා විසින් මූලින්ම සිදු කරන ලදි. ඒ අතර රජයේ මුද්‍රණාලය, තැපැල් දෙපාර්තමේන්තුව, ලංකා ගමනා ගමන මණ්ඩලය,

මැතිවරණ දෙපාර්තමේන්තුව, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සිදු කළ සාකච්ජා පිළිබඳ කරුණු දක්වන ලදි.

- ලංගම බස් රථ මැතිවරණය සඳහා යොදා ගැනීම සම්බන්ධව ලක්බිමේ මව්වරු සහ දියණියෝ සංවිධානයේ නියෝජිතවරිය අදහස් දක්වන ලදි. ලංගම සතු බස් රථ 6000ක ප්‍රමාණයෙන් 1/6 ක් එක් අපේක්ෂකයෙකුට ලබාදෙන බැවින් දිනකට මිලියන 2.5ක් පමණ ලංගම අහිමි වන බවත් සඳහන් කරන ලදි.

- 2014.12.19 වන දින ප්‍රචාරය වූ රූපවාහිනී ප්‍රවෘත්ති 14 අතුරින් 13ක් ම ජනාධිපතිවරයාගේ මැතිවරණ ව්‍යාපෘතියට අදාළව යොදාගෙන ඇත. ස්වාධීන රූපවාහිනියද එලෙස කටයුතු කර ඇත. එසේ වුවද පෞද්ගලික රූපවාහිනිය නාලිකා ඊට වඩා සාධාරණ ලෙස කටයුතු කර ඇති බවත් සඳහන් කරන ලදි. එසේම මැතිවරණ ප්‍රචාරක පුවරු ඉවත්වීම සිදු වන්නේ අඩුවෙනි. එය ක්‍රියාත්මක නොවීම පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයට වෙත යැමට ද අදහස් කරනත බව ප්‍රකාශ කරන ලදි.

- රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව :- රජයේ මුද්‍රණාලයේ ගැටළු පවතින බවත් එය මැතිවරණයේ ස්වාධීනත්වයට ගැටළුවක් වන බවත් සඳහන් කරන ලදි. එහිදී අදහස් දැක්වූ සභාපතිතුමා අප ඊයේ රැස්වීමේදී මේ පිළිබඳව විමසූ බවත් දින දෙකක් තුළ ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කැඳවන බවත් ප්‍රකාශ කරන ලදි.

- ප්‍රචාරක පුවරු :- ප්‍රචාරක පුවරු ඉවත් කිරීම පොලිසියේ කාර්යයක් නොවේ. එම පුවරු ඉදි කිරීම වැළැක්වීමට පොලිසිය පියවර නොගන්නේ මන්ද යන්න ට්‍රාන්ස්පේරන්සි ශ්‍රී ලංකා ආයතනය විමසන ලදි. ආයතනයන් ක්‍රියාත්මක වන බව

ජනතාවට ඒත්තු ගැන්විය යුතුය. නැතහොත් ජනතාව ආයතනය කෙරෙහි තබා තිබෙන විශ්වාසය බිඳවැටේ. 2014.12.18 දින දේශපාලන පක්ෂ මැතිවරණ කාර්යාලය ඉදිරිපිටදී විරෝධයක් පැවා. එම උද්ඝෝෂකයින් එහි දී පෙන්වා දීමට උත්සාහ කරේ මැතිවරණ නිරීක්ෂණ සංවිධාන තම කාර්ය ඉටු නොකරන බැවින් දේශපාලන පක්ෂ ලෙස තමන්ටම නිරීක්ෂණ කාර්ය සිදු කිරීමට සිදු වේය යන්නයි.

- ස්වාධීන මැතිවරණ කොමිසම :- ලක්බිමේ මව්වරු සහ දියණියෝ සංවිධානයේ නියෝජිතවරිය ස්වාධීන ආයතන නොමැති තත්ත්වයක් තුළ ජනතාව තුළ නිදහස් හා සාධාරණ මැතිවරණ සඳහා පවතින විශ්වාසය ගොඩනැගීම වෙනුවෙන් අප ශ්‍රී ලංකා මානව හිමිකම් කොම්ෂන් සභාව වෙත පැමිණි බවත්, මැතිවරණ ප්‍රචාරක පුවරු ඉවත් කිරීමට පොලිසියට නොහැකි වීම පිළිබඳව මානව හිමිකම් කොම්ෂන් සභාව මගින් පොලිසිය වෙත චක්‍රලේඛයක් හෝ යැවීමට හැකිනම් එය සුදුසු බව වැඩිදුරටත් සඳහන් කරන ලදි.

- ස්ථාන වෙන් කිරීම :- මේ පිළිබඳව මානව හිමිකම් කොම්ෂන් සභාව දිවයිනේ සියළු පළාත් පාලන ආයතන වෙත ක්‍රියාත්මක වියයුතු ආකාරය පිළිබඳ දැන්වීමක් යවා ඇති බව නීති ලේකම්තුමා ප්‍රකාශ කරන ලදි.

- තැපැල් ඡන්ද භාවිතා කිරීමේදී ගැටළු :- මුලතිව්, කිලිනොච්චි යන ප්‍රදේශවල තැපැල් ඡන්ද භාවිතා කිරීමේදී ගැටළු ඇතිවිය හැකිය. එම ප්‍රදේශ තුළ මැතිවරණ කොමසාරිස්වරයා විශේෂ නියෝජිතයින් යොදන ලෙස මෙම නියෝජිතයින් ඉල්ලීමක් කළා. එහිදී කොම්ෂන් සභාව සිය නිලධාරින් යෙදියහැකි නම් හොඳ බව වැඩිදුරටත් සඳහන් කරන ලදි. මැතිවරණ කොමසාරිස්ගේ නියෝජිතයින් යෙදවීමට

හැකි නමුත් නිරීක්ෂකයින්ගේ කාර්යය මානව හිමිකම් කොමිෂන් සභාව මගින් සිදු කළ නොහැකි බව නීති ලේකම්තුමා විසින් ප්‍රකාශ කරන ලදි.

- වතු කම්කරුවන්ගේ ජාතික හැඳුනුම්පත් එකතු කිරීමක් සිදුවිය හැකිය. පෙරදී ද මෙවැනි දේ සිදුවුනා. නාවලපිටිය වැනි ප්‍රදේශවල විශේෂ ආරක්ෂාවක් යොමු කළයුතුව තිබේ.

- මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයින් මැතිවරණ කටයුතු සඳහා යොදා ගැනීම :- මේ පිළිබඳව පැමිණිලි ඇති බව නියෝජිතයින් ප්‍රකාශ කරන අතර ඒ පිළිබඳව ඊයේ මාර්ග සංවර්ධන අධිකරිය කැඳවා පැවැත් වූ රැස්වීම දී කරුණු ඉදිරිපත් වූ බවත් ඊට උක්ත අධිකාරියේ සභාපතිවරයා පුද්ගලිකව මැදිහත්ව සොයා බලන බව ප්‍රකාශ කළ බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් දැනුම් දෙන ලදි.

- බන්ධනාගාර රැඳවියන් යොදා ගැනීම :- මේ පිළිබඳව කොමිෂන් සභාව වෙත ද වාර්තා වී ඇති බවත් ඒ පිළිබඳව අදාළ බලධාරීන් සමග සාකච්ඡා කරන ලද බවත් සඳහන් කරන ලදි. සංක්‍රමණික සේවකයින්ගේ ඡන්ද හිමිකම පිළිබඳව ඉදිරියේදී මැදිහත් වීමටත් සිදු කරන ලෙස නියෝජිත පිරිස ඉල්ලා සිටින ලදි.

- 2014 දෙසැම්බර් මස 11 වන දින Caffe සංවිධානයේ ලිපිය :- උක්ත දිනැතිව එහි විධායක අධ්‍යක්ෂවරයා 2014 දෙසැම්බර් මස 11 වන දින මැතිවරණ කොමසාරිස්වරයා සමග මානව හිමිකම් කොමිෂන් සභාව කැඳවා තිබූ රැස්වීම පිළිබඳව විවේචනාත්මක ස්වරූපයකින් කරුණු දක්වා ඇත. එම ලිපියට අනුව මැතිවරණය පිළිබඳව සිවිල් සංවිධාන ද එක්කර මැතිවරණ කොමසාරිස්වරයා සමග සාකච්ඡා පැවැත්වීම වඩාත් ඵලදායී බවට සඳහන් කර තිබුණි. නමුත් 2015

මැතිවරණ ක්‍රියාවලිය තුළ විවිධ පාර්ශවයන් එක් කර මානව හිමිකම් කොමිෂන් සභාවේ මැදිහත්වීම ළඝු කර දැක්විය නොහැක.

## පෞද්ගලික අංශයේ නිවාඩු පිළිබඳව දෙවන සාකච්ඡාව 2014.12.22

මැතිවරණ කොමසාරිස් වරයා කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යාංශයේ ලේකම්, කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු කොමසාරිස් ජනරාල් වරයා සාකච්ඡාවට එක්විය. කොමිෂන් සභාවේ සභාපතිතුමා මෙම සාකච්ඡාව මෙහෙයවීම සිදු කරන ලදි. එහිදී මැතිවරණ කොමසාරිස්තුමා දැක්වූයේ මැතිවරණ පනත තුළ පවතින ඉඩ ප්‍රස්ථාව පෞද්ගලික අංශය සඳහා මැතිවරණ වලදී නිවාඩු ලබාදීම සඳහා ක්‍රමවේදයක් නොමැති බවයි. මෙම තත්ත්වය කම්කරු ලේකම්තුමා ද පිළිගත්තා ලදි. ඒ අනුව ජනාධිපතිවරු පත් කර ගැනීමේ පනතේ පවතින විධිවිධාන අනුව පෞද්ගලික අංශය සඳහා ලබාදීමට නිවාඩු යෝජනා තමන් සකස් කර ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත එවිය හැකි බවත් එම යෝජනා මානව හිමිකම් කොමිෂන් සභාව මගින් නිර්දේශයක් ලෙස කම්කරු අමාත්‍යාංශය වෙත යොමු කිරීමත් මගින් වඩාත් ඵලදායී ලෙස මෙම කටයුත්තට මැදිහත් වියහැකි බවටත් අදහස් ඉදිරිපත් විය.

ඒ අනුව මැතිවරණ කොමසාරිස්වරයා පෞද්ගලික අංශ වල සේවා නියුක්තකයින් සඳහා නිවාඩු යෝජනා ඉක්මණින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත එවීමට එකග විය. මැතිවරණ කොමසාරිස්වරයා පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයින් සඳහා ජාතික මැතිවරණ වලදී වැටුප් හෝ පුද්ගලික නිවාඩු අහිමි වීමකින් තොරව ස්වකීය ඡන්දය දීමට හැකිවන පිනිස නිවාඩු ලබාදීම සඳහා යෝජනා 2014.12.23 දිනැතිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමුකරන ලද( ඇමුණුම් 04 බලන්න) . එම යෝජනා අධ්‍යයනය කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිතුමාගේ

අත්සන සහිතව කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යාංශයේ ලේකම් වෙත උක්ත කරුණ පිළිබඳ නිර්දේශය 2015 ජනවාරි 01 වන දින යොමු කරන ලදි. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශයන් පදනම්ව කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යාංශය විසින් 2015 ජනවාරි 05 වන දින දිණමිණ, Daly News සහ තිනකරන් ජාතික පුවත්පත් තුනෙහි භාෂා තුනෙන්ම මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශය දැන්වීමක් ලෙස පළ කරන ලදි. උක්ත නිර්දේශය සහ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා පෞද්ගලික අංශයේ සේවයේ නියුක්තිකයන්ට ජාතික මැතිවරණ වලදී නිවාඩු ලබාදීම පිළිබඳව මානව හිමිකම් කොමිෂන් සභා අන්තර්ජාල පිටුවේ ප්‍රවෘත්තිය 2015 ජනවාරි 06 වන දින පළ කරන ලදි[3]. එය සමග කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යාංශයේ අමාත්‍යවරයා විසින් උක්ත කරුණ පිළිබඳ පළ කළ පුවත්පත් දැන්වීම් තුන සිංහල, දෙමළ සහ ඉංග්‍රිසි ලෙස බාගත හැකි ලෙස සම්බන්ධතාවය ද තබන ලදි( ඇමුණුම් 05 බලන්න) .

**රාජ්‍ය නිලධාරීන් සහ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ ක්‍රියාත්මක වීම පිළිබඳ නියමය :**

2014.12.24 දිනැතිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ජනාධිපති ලේකම්තුමා සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, ත්‍රිවිධ හමුදා ප්‍රධානීන්/පොලිස්පති/අධ්‍යක්ෂ සිවිල් ආරක්ෂක බලකාය වෙත 2015 ජනාධිපතිවරණයේදී ක්‍රියාත්මක වීම පිළිබඳ නියමයන් නිකුත් කරන ලදි. මෙම නියමයන් තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, දණ්ඩ නීති සංගහය තුළ දක්නට ඇති රාජ්‍ය නිලධාරීන් යන්න මුලින්ම හඳුන්වා දීම සිදු කර ඇත. ඉන් අනතුරුව ඡන්දය ප්‍රකාශ කිරීම මූලික අයිතිවාසිකමක් ලෙස ශ්‍රී ලංකාව තුළ පිළිගෙන ඇති යන්න පිළිබඳ කරුණු දක්වා ඇත. ඒ අනුව ප්‍රධාන කරුණු

[3] http://hrcsl.lk/english/?p=2479

04ක් පිළිබඳ කොමිෂන් සභාව සියළු රාජ්‍ය නිලධාරීන්ගේ අවධානය යොමු කරන ලදි. ඒවා නම්,

- නීතිය අපක්ෂපාතීව හා සාධාරණව ක්‍රියාත්මක කළ යුතු ය.

- නීතිය ක්‍රියාත්මක නොකර සිටීම ද මූලික අයිතිවාසිකම් කඩකිරීමක් වන බව.

- නිල රාජකාරී ක්‍රියාත්මක නොකිරීම, අගතිගාමී බව, රාජකාරී නොකර හැරීම, අයුතු ලෙස ක්‍රියාත්මක කිරීම, බලය ඉක්මවා ක්‍රියාත්මක කිරීම, රාජ්‍ය දේපල හා සම්පත් යම් දේශපාලන පක්ෂ හෝ කණ්ඩායම් වෙනුවෙන් යොදවා ගැනීම හෝ යෙදීමට ඉඩ ලබාදීම හෝ තවත් කණ්ඩායමකට හානිකර ලෙස යොදා ගැනීම මූලික අයිතිවාසිකම් කඩවීමක් ලෙස එම නිලධාරීන් පුද්ගලික වගකීමක් වන බව.

- දේශපාලන අයිතිය නොමැති රාජ්‍ය නිලධාරීන් දේශපාලන කටයුතුවල යෙදීම ද දේශපාලන අයිතිත් පවතින රාජ්‍ය නිලධාරීන් තම රාජකාරී කාලය තුළ දේශපාලනයේ යෙදීම නැතහොත් තම රාජකාරී නිල බලය යොදාගනිමින් දේශපාලනයේ යෙදීම ද මැතිවරණ නීති කඩ කිරීමක් බව.

උක්ත නියමයන් ඉහත සඳහන් කළ නිලධාරීන් තමන් යටතේ තිබෙන සියළුම ආයතන වෙත යොමු කිරීම කරන ලෙස ද දන්වන ලදි. මෙම නියමයන් සිංහල දෙමළ සහ ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන්ම සකස් කර ඇත.

2014.12.26 වන දින මෙම නියමයන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සහ කොමිෂන් සභාව අන්තර්ජාල පිටුව තුළ ප්‍රවෘත්තියක් ලෙස පල කරන ලද අතර භාෂා

තුනෙන් සකස් කල එම නියමයන් එතුලින් බාගතහැකි පහසුවද සලසන ලදි[4]( ඇමුණුම් 06 බලන්න) .

**සිරකරුවන් මැතිවරණ කටයුතු වලට යොදා ගැනිම පිළිබඳව කරුණු විමසීම – 2014.12.24 :**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිතුමාගේ මූලිකත්වයෙන් මෙම රුස්වීම පවත්වන ලදි. ඒ සඳහා බන්ධනාගාර සහ පුනරුත්ථාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වරයා ද සහභාගී වූ අතර මැතිවරණ දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් අතිරේක මැතිවරණ කොමසාරිස් වරයෙක් සහභාගී විය.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා විසින් අකුරුස්ස නගරයේ රුස්වීමක් සඳහා සිරකරුවන් සැරසිලි කටයුතු වලට යොදාගත්තේ යැයි පළවූ ප්‍රවෘත්ති පිළිබඳ කරුණු ඉදිරිපත් කරන ලදි. මෙම පුවත බන්ධානාගාර දෙපාර්තමේන්තුව සතු මාතර පිටබැද්දර ප්‍රදේශයේ පවතින ඉඩමක නඩත්තු කටයුතු සඳහා සිරකරුවන් ගෙනයාමක් බවද එම අවස්ථා ඉලක්ක කර මෙම චෝදනා නගන බවත් කොමසාරිස් ජනරාල්වරයා සඳහන් කලේය. උක්ත අමාත්‍යාංශයේ ලේකම්වරයා ද එම කරුණ තහවුරු කරන ලදි.

මෙම තත්ත්වය තුල සිරකරුවන්ව ආගමික සහ පොදු කටයුතු වලට යොදා ගැනීම සඳහා ලබාදීම වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවීම සඳහා සියළු ඉහල නිලධාරීන් වෙත නියෝගයක් නිකුත් කල බව බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා ප්‍රකාශ කරන ලදි.

[4] http://hrcsl.lk/english/?p=2471

චෝදනා එල්ල කිරීම සඳහා යොදා ගන්නා ඡායාරූප මීට පෙර අවස්ථාවක සිරකරුවන් වෙනත් කාර්යයක නිරතව සිටියදී ගත් ඒවා බව මෙම නියෝජිතයින් අවධාරණය කරන ලදි.

## ආපදා තත්ත්වය සහ ඡන්දය භාවිතා කිරීමට අවස්ථාව ලබාදීම (2015.01.05)

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2014.12.31 දිනට දිවයින තුළ පවතින ආපදා තත්ත්වය පිළිබඳව නිකුත් කරන ලද දෛනික තත්ත්ව වාර්තා අනුව දිවයින තුළ පවුල් 22,671කට අයත් පුද්ගලයින් 77,941ක් දෙසැම්බර් මාසය තුළ රට තුළ සිදුවූ ආපදා තත්ත්වය තුළ අවතැන්ව ආරක්ෂිත ස්ථාන 434ක රඳවා ඇති බව වාර්තා කර ඇත. මෙම ජනතාව ජනවරි මස 08 වන දිනට යෙදෙන ජනාධිපතිවරණයේ සිය ඡන්දය කිසිදු බලපෑමකින් තොරව, නිදහස්ව සහ ස්වාධීනව දැමීම සඳහා අවකාශ සකස් කරදීම මෙම ආපදා තත්ත්වය සම්බන්ධයෙන් ක්‍රියාත්මකවීමේ වගකීම දරණ රාජ්‍ය නිලධාරීන්ගේ වගකීම බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ අදහස වේ.

ඒ අනුව කොමිෂන් සභාවේ සභාපතිතුමා ආපදා තත්වය පිළිබඳ වගකීම දරණ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් කොමිෂන් සභාව ඉදිරියේ කැඳවීමට තීරණය කරන ලදි. ඒ අනුව 2015 ජනවාරි මස 05 වන දින ලේකම්වරයා කොමිෂන් සභාව හමුවට කැඳවන ලදි. එම සාකච්ඡාවේ දී ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්වරිය එම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වෙබ් අඩවිය තුළ දෛනිකව යාවත්කාලීන වන දත්ත වලට පරිබාහිර තොරතුරු ඉදිරිපත් කිරීමක් කරන ලදි. ඒ අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වෙබ් අඩවිය තුළ දත්ත යොදාගෙන සකස් කළ සටහනක් පහත දැක්වේ.

## ශ්‍රී ලංකවේ 2014 දෙසම්බර් සහ 2015 ජනවාරි සිදුවූ ආපදා තත්වය

| දිස්ත්‍රිකය | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය අන්තර් ජාල පිටුව තුළ දැක්වෙන දත්ත(දෛනික දත්ත වාර්තා) | | | | | | ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් වරිය ඉදිරිපත් කළ දත්ත | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2014.12.31 දිනට | | 2015.01.02 දිනට | | 2015.01.04 දිනට | | 2015.01.05 දිනට | |
| | ආරක්ෂක මධ්‍යස්ථාන සංඛ්‍යාව | පුද්ගල සංඛ්‍යාව | ආරක්ෂක මධ්‍යස්ථාන සංඛ්‍යාව | පුද්ගල සංඛ්‍යාව | ආරක්ෂක මධ්‍යස්ථාන සංඛ්‍යාව | පුද්ගල සංඛ්‍යාව | ආරක්ෂක මධ්‍යස්ථාන සංඛ්‍යාව | පුද්ගල සංඛ්‍යාව |
| මන්නාරම | 31 | 6505 | 13 | 2977 | 4 | 180 | | |
| වව්නියාව | 52 | 5576 | 31 | 2985 | 5 | 322 | | |
| කිලිනොච්චි | 13 | 2233 | 13 | 2232 | 13 | 2232 | | |
| මුලතිව් | 02 | 428 | - | - | 2 | 437 | | |
| යාපනය | 00 | 000 | 00 | 00 | 00 | 00 | | |
| මාතලේ | 21 | 1118 | 09 | 383 | 6 | 218 | 2 | 69 |
| නුවරඑලිය | 46 | 2237 | 46 | 2237 | 44 | 2209 | 44 | 4443 |
| මහනුවර | 51 | 2809 | 29 | 1524 | 19 | 953 | 4 | 110 |
| කුරුණෑගල | 04 | 99 | 00 | 00 | 00 | 00 | | |
| පුත්තලම | 01 | 457 | 1 | 457 | 1 | 457 | | |
| ත්‍රිකුනාමලය | 41 | 28322 | 14 | 4382 | 1 | 160 | | |
| මඩකලපුව | 01 | 226 | 00 | 00 | 00 | 00 | | |
| අම්පාර | 03 | 685 | 02 | 620 | 2 | 620 | | |
| පොලොන්නරුව | 37 | 13148 | 37 | 13148 | 37 | 13148 | | |
| අනුරාධපුර | 26 | 3000 | 04 | 1010 | 4 | 1010 | | |
| බදුල්ල | 96 | 8869 | 86 | 6596 | 84 | 4443 | 59 | 1239 |
| මොනරාගල | 00 | 00 | 00 | 00 | 00 | 00 | | |
| කෑගල්ල | 04 | 112 | 4 | 112 | 6 | 157 | | |
| රත්නපුර | 00 | 00 | 00 | 00 | 00 | 00 | | |
| ගම්පහ | 01 | 35 | 1 | 35 | 1 | 35 | | |
| කොළඹ | 02 | 2000 | 2 | 2000 | 2 | 2000 | | |
| කැතර | 00 | 00 | 00 | 00 | 0 | 00 | | |
| මාතර | 00 | 00 | 00 | 00 | 00 | 00 | | |
| හම්බන්තොට | 02 | 83 | 02 | 83 | 02 | 83 | | |
| ගාල්ල | 00 | 00 | 00 | 00 | 00 | 00 | | |
| **එකතුව** | **434** | **77941** | **316** | **42771** | **255** | **30654** | | |

මූලාශ්‍රය: ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය අන්තර් ජාල පිටුව දෛනික දත්ත වාර්තා 2014.12.31, 2015.01.02, 2015.01.04, සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් වරිය 2015.01.05 දිනැතිව ඉදිරිපත් කළ දත්ත

මෙම දත්ත අධ්‍යයනය කිරීම මගින් පෙනීයන්නේ එක් දිනක් තුළ ආරක්‍ෂිත ස්ථාන සංඛ්‍යාව සහ එකි රඳවා සිටි පුද්ගලයින් සංඛ්‍යාව අති විශාල අඩුවීමක් වාර්ථා කරන බවයි.

ආපදාවලට ලක්වූවන්හට වියලි සලාක ලබාදෙන බවත් ඔවුන්ගේ ප්‍රදේශ තුළම කඳවුරු තිබෙන නිසා ප්‍රවාහන පහසුකම් සැපයීම එම පුද්ගලයින්ට අවශ්‍ය නොවන බව දිස්ත්‍රික් තේරීම්බාර නිලධාරීන් දැන්වූ බවත් ලේකම්වරිය පවසන ලදී. මේ පිළිබඳ පූර්ණ වාර්ථාවක් කොම්පන් සභාව වෙත සැපයීමට ලේකම්වරිය පොරොන්දු විය.

**දේශපාලන රැස්වීම් සඳහා පිට්ටනි ශාලා ලබා දීමේ අක්‍රමිකතා පිළිබඳ සාකච්ජාව**

ජනතා විමුක්ති පෙරමුණ සංවිධානය තුළ දේශපාලන රැස්වීමක් සඳහා ගම්පහ මහ නගර සභාවට අයත් ගම්පහ බස් නැවතුම් පොළ ලබා නොදීම පිළිබඳ සාකච්ජාව 2015.01.05 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොම්පන් සභාවේ සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙම සාකච්ජාව කැඳවන ලදී. එහිදී ගම්පහ මහ නගර සභාවේ නියෝජනය කරමින් එහි නාගරික කොමසාරිස්වරයා සහ නීති නිලධාරියෙකු මීට සහභාගී විය. ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරමින් බස්නාහිර පළාත් සභාව නියෝජනය කරමින් මන්ත්‍රීවරුන් දෙදෙනෙක් සහභාගී විය. ජනතා විමුක්ති පෙරමුණ උක්ත ස්ථානය ජනතා විමුක්ති පෙරමුණේ නායකයාගේ මූලිකත්තයෙන් රැස්වීමක් සඳහා ඉල්ලීමක් කළ විට මාර්ග තදබදය රැස්වීම පැවැත්වීම නිසා සිදුවේය යන කරුණ මුල්කරගෙන එම ඉල්ලීම නාගරික කොමසාරිස්වරයා විසින් ප්‍රතික්ෂේප කර ඇත. ඉන් පසුව එවකට බලයේ සිටි ජනාධිපතිවරයා සහභාගි වූ රැස්වීම සඳහා එම අදාළ ස්ථානය බාධාවකින් තොරව වෙන්කර දුන් බව පැමිණිල්ලක් ලෙස ඉදිරිපත් විය. එහිදී කරුණු දැක්වූ නාගරික කොමසාරිස්වරයා ප්‍රකාශ කළේ තමන් ජනතා විමුක්ති පෙරමුණ කළ ඉල්ලීම මාර්ග තදබදය සිදුවන නිසා ප්‍රතික්ෂේප කළ බවයි. නමුත් පසුව රැස්වීම සඳහා මූලික අනුමැතිය මහනගර සභාවේ සභාපතිවරයා මගින් ලබාදී තමන් වෙත අදාළ ඉල්ලීම ඉදිරිපත් වූ බවයි.

එහිදී එය ප්‍රතික්ෂේප නොකිරීම සම්බන්ධයෙන් පැහැදිලි කරුණු දැක්වීමක් කිරීමට නාගරික කොමසාරිස්වරයා අපොහොසත් විය. දේශපාලන බල අධිකාරීන් මගින් ගත් මෙම තීරණය නිසා එය ක්‍රියාත්මක කිරීම තුල රාජ්‍ය නිලධාරීන් වෙත වගකීම පැවරී ඇති බව සභාපතිතුමා ඔහුට දන්වන ලදී. ශ්‍රී ලංකා මානව හිමිකම් කොම්ෂන් සභාව මගින් දේශපාලන රැස්වීම පැවැත්වීම පිළිබඳ පළාත් පාලන ආයතන වෙත යැවූ මාර්ගෝපදේශය තමන් වෙත ද ලැබුණු බව නාගරික කොමසාරිස්වරයා පිළිගත්තා ලදී. මෙම ගැටලුව ගම්පහ මහ නගර සභාවේ සභාපතිවරයා කැඳවා වමසා බැලීමට කොම්ෂන් සභාවේ සභාපතිවරයා තීරණය කරන ලදී. ඒ අනුව ඉදිරි දිනයකදී ගම්පහ මහ නගර සභාවේ සභාපතිවරයා පුද්ගලිකව මීට අදාලව පෙනී සිටින ලෙස දන්වා සිතාසි යොමු කරන ලෙස උපදෙස් ලබාදෙන ලදී. එම ගැටලුවට සමාන ගැටලුවක් ජනතා විමුක්ති පෙරමුණ විසින් කිරිබත්ගොඩ නගරයේ දී රැස්වීමක් පැවැත්වීමට ස්ථානයක් වෙන්කර ගැනීමේ දී ද සිදුවිය. ඒ පිළිබඳව විමසීම සඳහා කැලණිය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා කැඳවා තිබුණ ද වෙනත් අත්‍යාවශ්‍ය රාජකාරියක් යෙදී ඇති නිසා වෙනත් දිනයක් ලබාදෙන ලෙස ඔහු කොම්ෂන් සභාවෙන් ඉල්ලීමක් කර තිබේ. ඒ අනුව එකී පැමිණිල්ල තවදුරටත් විභාග කිරීමට නියමිතව පවතී.

**මධ්‍යම සංස්කෘතික අරමුදල සිය කාර්ය මණ්ඩලය යාපහුවට කැඳවා ආයතනික වාර්ෂික සැලස්ම සාකච්ජා කිරීමට ගෙන ඇති පියවර දේශපාලන පරමාර්ථයකින් සිදුකල එකක් බවට නැගුණු චෝදනා පිළිබඳ සාකච්ජාව**

මෙම සාකච්ජාව 2015.01.05 දින කොම්ෂන් සභාවේ දී සභාපතිතුමාගේ මූලිකත්වයෙන් පවත්වන ලදී. එම සාකච්ජාව සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහභාගී වූ අතර පැමිණිලි ඉදිරිපත් කළ පැෆරල් ආයතනයේ නීති නිලධාරියෙකු සහභාගී විය. මෙම සාකච්ජාවේදී කරුණු දක්වූ මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ

ජනරාල්වරයා ප්‍රකාශ කර සිටියේ තම පාලනය යටතේ මෙම ආයතනය මහා භාණ්ඩාගාරයේ බරක් නොවන තමන් උපයාගන්නා ආදායමින් නඩත්තු වන ආයතනයක් බවට පත් කළ බවයි. එමෙන්ම ටිකට් පත් මුද්‍රණය ආදී කටයුතු වලදී පැවති ක්‍රමවේදයන් වෙනස්කිරීම මගින් ආයතනයේ ආදායම ඉහළ දැමීමට හැකිවූ බව ද ඒ නිසා වාර්ෂිකව තම කාර්යය මණ්ඩලයට ප්‍රසාද දීමනා ලබාදිය හැකි මට්ටමකට ආයතනය පත් කළ බවත් කියා සිටියි. 2015 ජනවාරි 04 වන දින ආයතනයේ 2015 වැඩ සැළැස්ම සහ වාර්ෂික ප්‍රසාද දීමනා ලබාදීම යාපහුවේදී විශය භාර අමාත්‍යවරයාගේ සහභාගීත්වයෙන් පැවැත්වීමට සැළසුම් කළ බවයි. එහෙත් කොමිෂන් සභාව වෙත ලැබුණු පැමිණිල්ලේ සඳහන් කරුණ වන්නේ රජයේ මුදල් යොදාගෙන 2015 ජනාධිපතිවරණයේ තරග වදින එවකට ජනාධිපතිවරයාට සහාය දක්වමින් ඔහුගේ ප්‍රතිරූපය ගොඩනැගීමට සිදුකරන කටයුත්තක් බවයි. එහිදී රජයට සම්බන්ධ වෘත්තීය සමිතියක් මෙහි සංවිධාන කටයුතු වලට මැදිහත්ව කටයුතු කිරීම පිළිබඳ පැමැණිල්ල තුළ කරුණු ඉදිරිපත් කර ඇත. උක්ත කරුණ පිළිබඳ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙම සාකච්ඡාවට පැමිණෙන ලෙස දන්වා කරණ ලද දැන්වීමත් සමග ප්‍රසාද දීමනා ලබාදීම සහ 2015 වාර්ෂික සැළැස්ම සාකච්ඡා කිරීම අත්හිටවූ බව මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රකාශ කරන ලදී. නමුත් පෙර සඳහන් කළ වෘත්තීය සමිතිය මගින් යාපහුවේදී රැස්වීමක් පැවැත්වූ බවත් ඊට අරමුදලේ ප්‍රතිපාදන යොදා ආහාර පාන හෝ ප්‍රවාහන හෝ වෙනත් කිසිදු දීමනාවක් ලබා නොදුන් බව ද මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

මෙහිදී කරුණු දැක්වූ මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිවරයා සඳහන් කළේ ප්‍රසාද දීමනා ලබාදීම සම්බන්ධයෙන් තමන්ගේ විරුද්ධත්වයක් නොමැති බවත් එය අධ්‍යක්ෂවරයාගේ මූලිකත්වයෙන් දේශපාලන කටයුත්තක් නොවන ආකාරයෙන් සිදු කළ යුතු බවත් ය. මෙම කටයුතු දේශපාලන ප්‍රවර්ධන කටයුත්තක් ලෙස සිදු නොකරන ලෙසද වැඩිදුරටත් දන්වන ලදී.

## 2015 ජනවාරි 08 පැවැත්වූ ජනාධිපතිවරණයට අදාළව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙහෙය වූ පැමිණිලි

2015 ජනවාරි 08 වන දින පවත්වන ලද ජනාධිපතිවරණය සම්බන්ධව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත තනි පුද්ගල පැමිණිලි 16ක් ගොනුවී තිබූ අතර ඊට අතිරේකව පැෆරල් සංවිධානය මගින් පැමිණිලි 09ක් ගොනුවී තිබුනි. මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ගොනුවී තිබූ සියළුම පැමිණිලි සම්බන්ධව මානව හිමිකම් කොමිෂන් සභාවේ පර්යේෂණ හා විමර්ශන අංශය විසින් කඩිනම් පියවර ගැනීමට කටයුතු කරන ලදි.

පැමිණිල්ලේ ස්වභාවය පිළිබඳව අවධානය යොමු කරන ලැබූ කොමිෂන් සභාව පැමිණිලි කිහිපයක් සම්බන්ධව පාර්ශවයන් මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිතුමා හා කොමසාරිස් මණ්ඩලය ඉදිරියට කැඳවා පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කරන ලදි. එම කැඳවීම් වලදී පැමිණිලිවල සඳහන් කරනු ලැබ තිබූ කරුණු සම්බන්ධව අවධානය යොමු කර අවශ්‍ය පියවරයන් ගැනීමට වගඋත්තරකාර පාර්ශවයන් කොමිෂන් සභාව ඉදිරියේ එකගතාවය පළ කරන ලදි( ඇමුණුම් 07 බලන්න)

කොමිෂන් සභාව වෙත යොමු කරන ලැබූ ලිඛිත පැමිණිලි සම්බන්ධව කඩිනම් පියවර ගැනීමට සමගාමීව පුවත්පත්, අන්තර්ජාල සහ විද්‍යුත් මාධ්‍ය වල පලවූ මැතිවරණයට අදාළ සිදුවීම් කිහිපයක් සම්බන්ධව සෘජු මැදිහත්වීමක් ද මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සිදු කරන ලදි. කොමිෂන් සභාව මගින් එලෙස සිදු කරන ලද සෘජු මැදිහත්වීම පිළිබඳව වඩාත් විස්තරාත්මක තොරතුරු ඇමුණුම් 08 පරිශීලනයෙන් ලබාගත හැකිය. (ඇමුණුම් 08 බලන්න)

මීට අමතරව පැෆරල් සංවිධානය මගින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කර තිබූ පැමිණිලි 09ක් සම්බන්ධව කොමිෂන් සභාව කඩිනම් පියවර ගන්නා ලදි. එහිදී පැමිණිලි කිහිපයක් සම්බන්ධව අදාළ පාර්ශවයන් කැඳවා පරීක්ෂණ පැවැත්වූ අතර තවත් පැමිණිලි කිහිපයක් සම්බන්ධව වගඋත්තරකරුවන් වෙතින් හදිසි වාර්තා කැඳවීමට කටයුතු කරන ලදි. මෙම වාර්තා කැඳවීම් සියල්ලටම වාර්තා ලබාදීමට වගඋත්තරකරුවන් කටයුතු කර ඇති අතර, වාර්තා අධ්‍යයනය කිරීමෙන් අනතුරුව පැමිණිලි සම්බන්ධව ගන්නා ලද පියවරයන් පිළිබඳව පහත වගු පරිශීලනය කිරීමෙන් අවබෝධ කර ගත හැකිය.

## 2015.01.08 දින පැවති ජනාධිපතිවරණයට අදාළව මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමු කරන ලද පැමිණිලි සම්බන්ධව ගන්නා ලද ක්‍රියා මාර්ග

| අංකය | පැමිණිලි අංකය, පැමිණිලිකරු සහ දිනය | වගඋත්තරකරු | පැමිණිල්ල | ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 01 | HRC/4948/14/B<br><br>එස්.සී.සූරියආරච්චි<br><br>දිනය -2014.12.22 | 1. මැතිවරණ කොමසාරිස්<br><br>2. ලේකම්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය<br><br>3. ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශීය කටයුතු අමාත්‍යාංශය | සංවර්ධන නිලධාරීන් දේශපාලන කටයුතුවලට යොදවා ගැනීම | 2014.12.29 වාර්තා කැඳවීම<br><br>2014.12.31 ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වාර්තාව ලබාදී ඇත.<br><br>කිසිඳු නිලධාරියෙකු පවරන ලද රාජකාරි කටයුතු වලට අමතරව දේශපාලන කටයුතු උදෙසා නිලධාරීන්ට උපදෙස් දී නොමැති බව දන්වා ඇත. එවැනි දෑ නොකළ යුතු බවට දැනුම්දුන් අතර, පැමිණිල්ල ඉදිරියට ගෙනයාමට නිශ්චිත තොරතුරු ලබාදී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| 02 | HRC/4948/14/A<br><br>එල්.සී.කේ.වීරවර්ධන<br><br>දිනය -2014.12.22 | 1.අධ්‍යක්ෂ ජනරාල් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව<br><br>2.සහකාර අධ්‍යක්ෂවරු දිස්ත්‍රික් ධීවර කාර්යාලය | තැපැල් ඡන්ද භාවිතා කිරීම සඳහා 2014.12.23 හා 2014.12.24 දිනයන් වෙන් කර තිබියදී එම අවස්ථාව නිලධාරීන්ට අහිමිවන පරිදි නාරාහේන්පිට ශාලිකා ශාලාවේදී 2014.12.23 පැවැත්වෙන ජාතික සම්මේලනයට අදාළ නිලධාරීන් කැඳවීම. | තැපැල් ඡන්දය 2014.12.23 පැවැත්වෙන බැවින් වගඋත්තරකරුවන් දුරකථන මගින් සම්බන්ධ කර ගැනීමට උත්සහ කළද ව්‍යාර්ත විය. කෙසේ වෙතත් පරීක්ෂා කිරීමේදී තැපැල් ඡන්දය අහිමිවීමේ අවස්ථාවක් ඇතිවී නොමැති බව පෙනී ගොස් ඇත. |
| 03<br>04 | HRC/4836/14<br>HRC/4837/14<br><br>නාමල් රාජපක්ෂ<br>මංජුල පතිරාජ<br><br>දිනය - 2014.12.12 | 1. සභාපති රූපවාහිනී සංස්ථාව<br><br>2. මැතිවරණ කොමසාරිස් ජනරාල් | රාජ්‍ය සම්පත් ජනාධිපති අපේක්ෂක මහින්ද රාජපක්ෂ මහතාගේ මැතිවරණ ප්‍රචාරණයට යොදා ගැනීම. අනුරාධපුරයේ පවත්වන ලද මැතිවරණ ප්‍රචාරක රැලිය සජීවීව විකාශනය කිරීම | 2014.12.18 දින සභාපතිතුමා ඉදිරියට කැඳවන ලද ස්වාධීන රූපවාහිනී සේවය වෙනත් දිනයක් අවශ්‍ය බවට ලිඛිතව දැන්වීමක් කරන ලදී.<br><br>ජාතික රූපවාහිනී සේවය වගඋත්තරකරුවන් ජනාධිපති අපේක්ෂක මහින්ද රාජපක්ෂ මහතාගේ රැලිය ප්‍රචාරය කරන ලද්දේ මුදල් ලබා ගැනීමේ පදනම මත බව දන්වන ලදී. එය තහවුරු කිරීමට ලේඛන ඉදිරිපත් කරන ලදී. එසේම මුදල් ගෙවා අනෙකුත් අපේක්ෂකයන්ට ද එය ලබාදීමට හැකි බව ප්‍රකාශ කරන ලදී. කෙසේ වෙතත් පසුව, ඒ ආකාරයෙන් |

| | | | | |
|---|---|---|---|---|
| | | | | ක්‍රියාකර නොමැති බව අනාවරණය වූ අතර, ඉදිරියේදී තවදුරටත් විමර්ශන කටයුතු කිරීමට නියමිතය. |
| 05 | HRC/5030/14<br><br>ඒ.එස්.රන්වල<br><br>දිනය -2014.12.30 | 1. නාගරිකකොමාසරිස් ගම්පහ<br><br>2. සභාපති ප්‍රාදේශිය සභාව කැළණිය<br><br>3. පොලිස් ස්ථානය - ගම්පහ<br><br>4. මැතිවරණ කොමසාරිස් | 1. 2014.12.09 දින පැවැත්වෙන මැතිවරණ ප්‍රචාරක රැලියකට ගම්පහ බස් නැවතුම් පළ භූමිය ලබාදීම සාධාරණ හේතුවක් රහිතව ප්‍රතික්ෂේප කිරීම<br><br>2. 2015.01.02 වන දින පැවැත්වෙන මැතිවරණ ලියකට කිරිබත්ගොඩ පොදු වෙළඳපොළ භූමිය හා පරණ බස් නැවතුම්පල භූමිය ලබාදීම ප්‍රතික්ෂේප කිරීම. නමුත් එක්සත් ජනතා නිදහස් සංධානයේ රැළිකයට පසුව එම ස්ථාන ලබාදී තිබීම. | 2014.01.05 දින සභාපතිතුමා ඉදිරිපිට පාර්ශවයන් කැඳවන ලදි.<br><br>02 වන වගඋත්තරකරු වෙනත් දිනයක් ඉල්ලා ඇත.<br><br>03 වන වගඋත්තරකරුට එරෙහිව පැමිණිල්ල පවත්වාගෙන යමාට තරම් කරුණු නොමැති බැවින් එම නිලධාරියා වගඋත්තරකාර භාවයෙන් ඉවත් කිරීමට තිරණය කර ඇත.<br><br>01 හා 04 නැවත කැඳවා ඉදිරියටත් විභාග කිරීමට තිරණය කරන ලදි. |
| 06 | HRC/4937/14<br><br>බත්තරමුල්ලේ | පොලිස්පතිතුමා | 2015 ජනාධිපතිවරණ අපේක්ෂකයකු වන | 2012.12.18 දින සභාපතිතුමා ඉදිරියට පොලිස්පතිතුමා, නිතිය හා සාමය පිළිබඳ |

| | | | | |
|---|---|---|---|---|
| | සීලරතන හිමි<br><br>දිනය -2014.12.22 | | තමන්ට ආරක්ෂාව සඳහා පොලිස් නිලධාරින් ලබා නොදීම සම්බන්ධව | අමාත්‍යාංශයේ ලේකම්තුමා හා මැතිවරණ කොමසාරිස් කැඳවා කරන ලද පළමු සාකච්ජාවේදි උක්ත කරුණ පිලිබඳව සාකච්ජාවට බඳුන් වූ බැවින් ඉදිරි පියවර ගැනිම සිදු නොකරන ලදි. |
| 07 | HRC/4808/14<br><br>ටී.පටිටියකුඹුර<br><br>දිනය -2014.12.10 | නගර සභා හා ප්‍රාදේශිය සභාවල නගරාධිපතිවරු හා ප්‍රාදේශිය සභා සභාපතිවරු | 1. ජනාධිපති අපෙක්ෂක මහින්ද රාජපක්ෂ මහතා රාජ්‍ය සම්පත් මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා භාවිතා කිරිම.<br><br>2. මංමාවත්වල කටවුට් ප්‍රදර්ශනය කිරිම පිලිබඳව | පැමිණිල්ලේ සඳහන් කාරණා පිලිබඳව මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ මැතිවරණ කොමසාරිස්වරයා, රාජ්‍ය නිලධාරින්, පොලිස්පති වරයා කැඳවා කරන ලද සාකච්ජාවෙන් පසුව 2014.12.12 වන දින සියළුම නාගරික කොමාසරිස්වරුන් හා ප්‍රාදේශිය සභා ලේකම්වරුන් වෙත සභාපතිතුමාගේ අත්සනින් යුතුව නිවේදනයක් නිකුත් කළ බැවින් පැමිණිලිකරු කොමිෂන් සභාව ඉදිරියට කැඳවිමක් සිදු නොකරන ලදි. |
| 08 | HRC/4887/14<br><br>එස්.ලියනගේ (සමස්ථ ලංකා ප්‍රවාහන සේවක සංගමය)<br><br>දිනය -2014.12.18 | සභාපති ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය | ලංගම සේවකයන්ගේ නිදහස් ඡන්දය භාවිතා කිරිමට බාධාවන ලෙස ශ්‍රී ලංකා නිදහස් ප්‍රවාහන සේවක සමිතිය පාලන අධිකාරියට බලපෑම් | 2012.12.18 මෙම පැමිණිල්ල ගොනුවන අවස්ථාව වනවිට ශ්‍රී ලංගම සභාපතිතුමා, මැතිවරණ කොමසාරිස් හා තවත් රජයේ නිලධාරින් කැඳවා සභාපතිතුමා හා කොමසාරිස් මණ්ඩලය කරන ලද සාකච්ජාවේදි දීර්ඝ වශයෙන් සාකච්ජාවට බඳුන් |

| | | | | |
|---|---|---|---|---|
| | | | කිරිම | වූ අතර මෙම පැමිණිල්ලේ සදහන් කාරණාව ද සාකච්ඡාවට භාජනය කරන ලදි.<br><br>එම සාකච්ඡාවේදි මෙම පැමිණිල්ලේ සදහන් කරුණු පිළිබදව සොයා බැලිමට පුද්ගලිකව කටයුතු කරන බව ශ්‍රී ලංගම සභාපතිවරයා එකගත්වය පළකරන ලද අතර. ඒ පිළිබදව පසුව පැමිණිලි ඉදිරිපත්ව නොමැත. |
| 09 | HRC/4903/14<br><br>ඩි.ගන්කන්ද<br><br>දිනය -2014.12.18 | 1. සාමාන්‍යාධිකාරි සබරගමුව මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරිය<br><br>2. මැතිවරණ කොමසාරිස් | 2015.01.02 වන දින ජනාධිපති අපේක්ෂක මෛත්‍රිපාල සිරිසේන මහතාගේ මැතිවරණ ප්‍රචාරක රැස්වීමට පැල්මඩුල්ල බස් නැවතුම්පල ආශ්‍රිත භූමිය ලබාදෙන ලෙසට සාමාන්‍යාධිකාරි මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය සබරගමුව පලාත මගින් ඉල්ලිමක් කල බව. එම ඉල්ලිම ප්‍රතික්ෂේප කරන | 2014.12.22 වගඋත්තරකරුවන්ගෙන් වාර්තාවක් කැදවන ලදි.<br><br>2014.12.23 දිනැති වගඋත්තරකරුවන් අංක සපු දරන ලිපිය මගින් දන්වා ඇත්තේ අදාළ භූමිය ලබාදීමට කටයුතු කළ බවයි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ලද බවත් පැමිණිලිකර සිටි. | |
| 10<br>11<br>12 | HRC/4833/14<br>HRC/4834/14<br>HRC/4835/14<br><br>ඒ.එස්.එම්. පෙරේරා<br><br>දිනය -2014.12. | 1. සභාපති<br>ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව<br><br>2. සභාපති<br>රූපවාහිනී සංස්ථාව<br><br>3. සභාපති<br>ස්වාධීන රූපවාහිනී සේවය | 2015.01.08 දින පැවැත්විමට නියමිත ජනාධිපතිවරණයෙදි එක්සත් ජනතා නිදහස් සංධානයේ අපේක්ෂක මහින්ද රාජපක්ෂ මහතා විසින් සිය මැතිවරණ ව්‍යාපාරය ආරම්භ කරමින් 2014.12.11 වන දින අනුරාධපුරයේදි පවත්වනු ලැබූ රැස්වීම වගඋත්තරකාර ආයතන මගින් සජිවිව විකාශනය කිම | HRC/4836/14 සහ HRC/4837/14 පැමිණිලි සඳහා පාර්ශවකරුවන් 2014.12.18 දින සභාපතිතුමා ඉදිරියට කැඳවා කරන ලද සාකච්ඡාවේදි දීර්ඝ වශයෙන් සාකච්ඡාවට ලක් කරන ලද අතර සභාපතිතුමා විසින් වගඋත්තරවැන්ට අවශ්‍ය උපදෙස් ලබාදීම ද සිදු කරන ලදි. ඊට අමතරව මෙම පැමිණිලි සඳහා ද වාර්තා ලබාදෙන ලෙස වගඋත්තරකරුවන් වෙත දන්වන ලදි. තවදුරටත් විමර්ශනය වෙමින් පවති. |
| 13 | HRC/5031/14<br><br>සී.එම්.කළුගේ<br><br>දිනය -2014.12.30 | 1. අධ්‍යක්ෂ ජනරාල් දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව<br><br>2. සභාපති<br>ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය<br><br>3. මැතිවරණ කොමසාරිස් | ජනාධිපති අපේක්ෂක මහින්ද රාජපක්ෂ මහතාගේ රුව ඇතුලත් කරමින් වගඋත්තරවැන් විසින් ලිතක් මුද්‍රණය කර බෙදා හැරිමට කටයුතු කරන බව | 2014.12.30 දිනැතිව වගඋත්තරවරුන්ගේ වාර්තා කැඳවීමට කටයුතු කරන ලදි. 2015.01.06 දින ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් හා දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් වාර්තා ලබාදි ඇත. ඔවුන් දන්වා ඇත්තේ වාර්ෂිකව ලිත් නිකුත් කිරිමේ කාර්යය සිදු කරන |

| | | | | |
|---|---|---|---|---|
| | | | | බවත් එය මහින්ද රාජපක්ෂ මහතා ප්‍රවර්ධනය කිරීමේ අරමුනින් මැතිවරණය ඉලක්ක කර නිකුත් කිරීමක් නොවන බවත් තවදුරටත් අදාළ ලිත් මැතිවරණයට පෙර, මුද්‍රණය කරන ලද්දක් බවටද සදහන් කරන ලදි.. ඒවා බෙදා හැරීම තවකාලිකව අත්හිටුවන ලෙසට දන්වන ලදි. මෙය මැතිවරණ වරදක් නිසා මැතිවරණ කොමසාරිස්ගේ අවධානයට ද ලක් කරන ලදි.<br><br>2014.12.31 දින පැෆරල් සංවිධානය මගින් ද මේ කරුණ පිළිබදව මානව හිමිකම් කොම්පන් සභාව වෙත දැනුම් දීමක් සිදු කර ඇත. |
| 14 | HRC/5071/14<br><br>එස්.පෙරේරා<br><br>දිනය -2014.12.29 | සභාපති,<br>රූපවාහිනි සංස්ථාව | නව ප්‍රජාතන්ත්‍රවාදි පෙරමුණේ ලේකම් ශාමිලා පෙරේරා කොම්ෂන් සභාව වෙත 2014.12.29 දිනැතිව පැමිණිල්ලක් යොමු කරමින් දන්වා ඇත්තේ 2015 ජනවාරි 08 ජනාධිපතිවරණය විපක්ෂයේ පොදු | මෙම පැමිණිල්ල ලැබීමෙන් පසුව 2014.12.30 පැමිණිල් පිළිබඳව කඩිනම් පියවර ගැනිම පිණිස ශ්‍රී ලංකා මානව හිමිකම් කොම්පන් සභාව විසින් මැතිවරණ කොමාසරිස් වරයා වෙත යොමු කිරිම කර ඇත.<br><br>එම යොමු කිරිමෙන් පසුව මැතිවරණ කොමසාරිස් |

| | | | | |
|---|---|---|---|---|
| | | | අපේක්ෂක ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ජයග්‍රහනය වෙනුවෙන් සංවිධානය කරනු ලබන කාන්තා සමූළුව වෙනුවෙන් සජිවි ප්‍රචාරය කිරිමට අවස්ථාව ලබාදිමට කටයුතු කරන ලෙසය.<br><br>ජනාධිපති අපේක්ෂක මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රචාරක වැඩ සටහන් වලට ලබා දෙන සජිවි විකාශයන්ට සමානව විපක්පයේ පොදු අපේක්පක වෙතද සමාන අවස්ථා ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇත. | වරයා විසින් 2014.12.30 දිනට කොමිෂන් සභාව වෙත පිළිතුරක් ලබාදිමට කටයුතු කර ඇත. එම පිළිතුරෙන් දන්වා ඇත්තේ අදාළ ගාස්තු අයකර ගැනිමෙන් පසුව උක්ත වැඩ සටහන ප්‍රචාරය කිරිමට කටයුතු කරන ලෙසට වගඋත්තරකරුවන්ට දැනුම් දුන් බවයි. |
| 15 | බස්නාහිර පළාත්, පළාත් සභා මන්ත්‍රී එස්.එම්.මරික්කාර් මහතා<br><br>දිනය -2015.01.05 | පොලිස්පතිතුමා | 2015.01.04 දින සිට තම ආරක්පාව සදහා ලබාදි තිබූ පොලිස් නිලධාරින් දෙදෙනා ඉවත් කිරිම මගින් තමාගේ | මෙම ලිපිය ලැබිමෙන් පසුව 2015.01.06 දින කොමිෂන් සභාව පොලිස්පතිතුමා වෙත ෆැක්ස් පණිවිඩයක් මගින් ඉහත කරුණ පිළිබඳව පරික්පා කර වාර්තාවක් |

| | | | | |
|---|---|---|---|---|
| | | | ආරක්ෂාවට තර්ජනයක් ඇතිවී ඇති බවට. | ලබාදීමට කටයුතු කරන ලෙසට දැනුම් දෙන ලදි.<br><br>පොලිස්පතිවරයා 2015.01.12 දින වාර්තාවක් මගින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දන්වා ඇත්තේ එස්.එම්.මාරික්කාර් මහතා වෙත පවතින තර්ජන සම්බන්ධයෙන් රාජ්‍ය බුද්ධි සේවාව වෙතින් වාර්තාවක් කැඳවන ලද බවත් එම වාර්තාව මගින් එස්.එම්.මරික්කාර් මහතාට දේශපාලික අන්තවාදී හෝ වෙනත් කණ්ඩායමකින් තර්ජන පවතින බවට නිශ්චිත තොරතුරු අනාවරණය වී නොමැති බවය. |
| 16 | රම්ලාන් මුහම්මදි රන්වර් මහතා<br><br>දිනය -2015.01.01 | පොලිස්පතිතුමා | ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රස් පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ පොලිස් ආරක්ෂාව විසන්ධි කිරීම | එම ලිපයේ කරුනු සැලකිල්ලට ගැනීමෙන් පසුව 2015.0.06 දින එම ලිපියේ කරුණු පිළිබඳව පරික්ෂා කර වාර්තාවක් ලබා දෙන ලෙස පොලිස්පතිවරයාට දැන්වා යැවීමට කටයුතු කරන ලදි.<br><br>2015.01.08 දින පොලිස්පතිවරයා විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පිළිතුරක් ගොනු කිරීමට කටයුතු කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | | එහි සඳහන් වන්නේ නැගෙනහිර පළාත් සභා පන්ත්‍රි ආර්.එම්.අන්වර් මහතා වෙත තර්ජන සම්බන්ධයෙන් ආරක්ෂක බුද්ධි සේවයේ වාර්තාවක් කැඳවන ලද බවත් විශේෂ ආරක්ෂාවක් ලබාදීමට අවශ්‍යබවට කරුණු වාර්තා වී නොමැති බවත්ය. |

## ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සෘජු මැදිහත්වීම්

| අංකය | පැමිණිල්ල | ක්‍රියාමාර්ග |
|---|---|---|
| 01 | 2014.12.22 දින The Island පුවත්පතේ පලවූ ලිපියක මඩකලපුව දිස්ත්‍රික්කයේ සිංහල ගම්මානයක පුරවැසියන්ගේ ඡන්ද හිමිකම පිළිබඳ ගැටළුවක් සම්බන්ධව ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා මැතිවරණ ප්‍රචාරක රැස්වීමක් අමතමින් සිටියදී පොළපාලියකින් ඒ දෙසට ගමන් කිරිමට මෙම පිරිස උත්සහ කර ඇත. එහිදි පොලිසිය සමග මෙම කණ්ඩායම ගැටුමක් ඇතිකර ගෙන ඇති අතර ඒ අවස්ථාවේ පුද්ගලයෙක් තිරුවත්ව ප්‍රධාන මාර්ගයේ ගෙන එන දර්ශනයක් ලිපියේද ප්‍රදර්ශනය කර තිබුනි. | මේ පිළිබඳව පරික්ෂා කර ප්‍රධාන කාර්යාලයට වාර්තා කරන ලෙස ප්‍රාදේශීය සම්බන්ධිකරණ නිලධාරිවරයා වෙත උපදෙස් ලබා දුන් අතර, ඒ ගැන විමර්ශනය කර පුත්තලම් කාර්යාලයට වාර්තාව ඉදිරිපත් කර ඇති අතර, එය තවදුරටත් පරික්ෂණ කරමින් පවති. |
| 02 | හපුතලේ එක්සත් ජාතික පක්ෂ සංවිධායකවරයාට සහ ආධාරකරුවන්ට 2014 දෙසැම්සබර් මස 20 වන දින පොලිස් නිලධාරින් බලා සිටියදි පහරදුන් බවට The Island පුවත්පත 2014.12.22 දින වාර්තා කර තිබුනි. | මේ පිළිබඳ කොමිෂන් සභාවේ විශේෂ අවධානය යොමුවූ අතර, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි - තංගල්ල සහ මූල්සථාන පොලිස් පරික්ෂක හම්බන්තොට වෙත 2014.12.23 කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටින ලෙසට සිතාසි නිකුත් කරන ලදි.<br><br>තැපැල් ඡන්දය හේතුවෙන් 2014.12.23 දින පෙනී සිටිමට හැකියාවක් නොමැති බවත් වෙනත් දිනයක් ලබා දෙන ලෙසත් දන්වා වගඋත්තරකරුවන් 2014.12.23 දිනම ෆැක්ස් පණිවිඩ ලබාදෙන ලදි. |

| | | |
|---|---|---|
| | | ඒ අනුව මැතිවරණ රාජකාරින්හි පොලිස් නිලධරයන් යෙදෙන බැවින් මැතිවරණයෙන් පසුව වගඋත්තරකරුවන් නැවත කැඳවා පරික්ෂණකෙරෙමින් පවති. |
| 03 | 2014.12.15 දින ලංකාදීප පුවත්පෙත් අන්තර්ජාල සංස්කරණය කල පලවූ " තිල් ජම්පර අස්සේ" පලවූ ලිපිය මගින් අකුරුස්සේ දේශපාලන රැලියට සිර කරුවන් 44 දෙනෙකු යොදා ගත් බවට ජායා රූප සහිතව කරුණු දක්වා තිබුනි. | මේ පිළිබඳව මානව හිමිකම් කොමිෂන් සභාව විශේෂ අවධානය යොමු කොට 2014.12.24 දින පුනරුත්තාපන හා බන්ධනාගාර අමාත්‍යාංශයේ ලේකම්වරයා හා බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වරයා සිතාසි මගින් කොමිෂන් සභාව ඉදිරියට කැඳවන ලදි.<br><br>එහිදි පුවත්පතේ පලවූ වාර්තාව පිළිබඳව වගඋත්තරකරුවන් සමග දීර්ඝ වශයෙන් කරුණු විමසන ලදි.<br><br>එහිදි බන්ධනාගාර කොමාසරිස් ජනරාල් වරයා වාර්තාවේ පළකර තිබූ ජායා රූප දෙපාර්තමේන්තුවේ පැවති වෙනත් වැඩසටහනකට බන්ධනාගර රැඳවියන් යොදාගත් අවස්ථාවක් බවත්, මැතිවරණ ප්‍රචාරය සඳහා යොදා ගැනිමක් නොවන බවත් ප්‍රකාශ කරන ලදි.<br><br>ඊට අමතරව දෙපාර්තමේන්තුව අවතින් ඉදිරිකරන බන්ධනාගාර පරිශ්‍රයක සුද්ද පවිත්‍ර කිරිමේ කටයුතුවලට රැගෙන යන බන්ධනාගාර රැඳවියන් පිරිසක් සම්බන්ධයෙන් මෙම පුවත සාවද්‍ය ලෙස පළකර ඇති බවටද කරුණ දක්වන ලදි. |
| 04 | 2014 දෙසැම්බර් මස පැවති ගංවතුර සහ ආපදා තත්වයන් පදනම් කර ගනිමින් අති විශාල පිරිසක් අවතැන්වීම හේතුවෙන් තාවකාලික ආරක්ෂිත ස්ථානවල | මෙම අන්තර්ජාල පිටුවෙහි පැවැති තොරතුරු දත්ත, පදනම්ව ආපදා කළමණාකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමිය කැඳවා සාකච්ඡාවක් කළ යුතු බවට කොමිෂන් සභාව තීරණය කරන ලදි. |

| | | |
|---|---|---|
| | රදවා සිටින තත්වයක් ආපදා කලමණාකරණ මධ්‍යස්ථානයේ අන්තර්ජාල පිටුව මගින් වාර්තා කර තිබුනි. | ඒ අනුව 2015.01.05 දින අමාත්‍යාංශයේ ලේකම් තුමිය කොමිෂන් සභාවට කැඳවා පහත කරුණු පිළිබඳව සාකච්ඡා කරන ලදි.<br><br>ආපදා කලමණාකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමිය තාවකාලික රැදවුම් මධ්‍යස්ථානවල නවාතැන් ගෙන සිටි ඡන්දය භාවිතා කිරීමට කිසිදු ආකාරයක අවහිරතාවයක් නොමැති බවට ලේඛන සහිතව කරුණු ඉදිරිපත් කරන ලදි.<br><br>ඒ අනුව අවතැන්වූවන්හට තම ඡන්දය භාවිතා කිරීමට ගැටළුවක් නොමැති බවට කොමිෂන් සභාව වෙත පැහැදිලි කරුණු ඉදිරිපත් වූ බැවින් ඉදිරියට පරීක්ෂණ අවශ්‍ය නොවන බවට කොමිෂන් සභාව තීරණය කරන ලදි. |
| 05 | මැතිවරණය සඳහා පෞද්ගලික අංශයේ සේවකයන්හට නිවාඩු ලබාදීම සම්බන්ධව | කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ ලේකම්, කම්කරු කොමසාරිස් ජනරාල්වරයා සහ මැතිවරණ කොමාසරිස් ජනරාල් 2014.12.19 සහ 2014.12.22 දින කැඳවා සාකච්ඡා කරන ලදි.<br><br>මැතිවරණ වලදි පෞද්ගලික අංශයේ සේවකයන්හට නිවාඩු ලබාදීම පිළිබඳව ගැටළුවක් පවතින බවට කරුණු අනාවරණය වූ බැවින් 2014.12.19 හා 2014.12.22 යන දිනයන්හිදි නිලධාරීන් කොමිෂන් සභාව ඉදිරියට කැඳවන ලදි.<br><br>මෙම සාකච්ඡාවේදි පෞද්ගලික අංශයේ නිවාඩු පිළිබඳව දීර්ඝව සාකච්ඡා කරන ලද අතර නිවාඩු ලබා දෙන ලෙසට කොමිෂන් සභාවෙන් නිර්දේශයක් නිකුත් කරන ලෙස නිලධාරීන් කොමිෂන් සභාවෙන් ඉල්ලීමක් කරන ලදි. |

| | | |
|---|---|---|
| | | එම ඉල්ලීමට අනුව 2015.01.01 දින ලේකම් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය වෙත පෞද්ගලික අංශයේ නිවාඩු පිළිබඳව කොමිෂන් සභාවේ නිර්දේශය ලබා දෙන ලදි. එම නිර්දේශය පදනම් කර ගෙන කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යවරයා 2015.01.05 දින දිණමිණ Daily News සහ Thinakuran යන පුවත්පත්වල පෞද්ගලික අංශයේ නිවාඩු පිළිබඳව කොමිෂන් සභාවේ නිර්දේශය ඇතුලත් දැන්වීමක් පල කරන ලදි. |

## ජනාධිපතිවරණය සම්බන්ධව පැෆරල් සංවිධානය මගින් යොමු කරන ලද පැමිණිලි

| අංකය | පැමිණිල්ල | ක්‍රියාමාර්ග |
|---|---|---|
| 01 | රජයේ මුදල් භාවිතා කරමින් මැතිවරණය ඉලක්ක කර සිල් රෙදි බෙදා දිම සම්බන්ධයෙන් යන හිසින් යුක්තව යොමු කරන ලද ලිපිය.<br><br>එකී පැමිණිල්ලේ **කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ** කෝටි සියයක (10,000,000) මුදල් භාවිතා කරමින් සිල් රෙදි මීටර් 5 ක් බැගින් ඒකක ලක්ෂ 08ක් විහාරස්ථාන හරහා බෙදා දිමට කටයුතු කරන බවට සඳහන් කර තිබිම. | මෙම ලිපියේ අඩංගු කරුණු පිළිබඳව 2015.01.05 දින කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙතින් වාර්තාවක් කැඳවන ලද අතර, 2015.01.08 දිනැතිව වාර්තාවක් ලබාදෙමින් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශ ලේකම් තුමාගේ සම්බන්ධිකරණ ලේකම්වරයා දන්වා ඇත්තේ වාණිජ කටයුතු අමාත්‍යාංශයේ අරමුදලින් කිසිදු මුදලක් භාවිතා කර නොමැති බවයි. තවදුරටත් ආයතනික මුදල් යොදා ගෙන ඇති බවට කරුණු ඉදිරිපත් කළ හැකිනම් ඉදිරි විමර්ශන කටයුතු පවත්වා ගෙනයාමට කෙමිෂන් සභාව තීරණය කර ඇත. |
| 02 | 2014.12.16 දිනැතිව **මාර්ග සංවර්ධන අධිකාරියේ** සේවකයන් මැතිවරණ කටයුතු සඳහා යොදා ගැනිම සම්බන්ධවයි යන හිසින් යුක්තව යොමු කරන ලද ලිපිය. | 2014.12.18 වන දින මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා පෞද්ගලිකව කැඳවා කොමිෂන් සභාවේ සභාපතිවරයා හා කොමසාරිස් මණ්ඩලය ඉදිරියේ සාකච්ඡාවේදි මෙම කාරණය පිළිබඳව දිර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලද අතර එම සාකච්ඡාවේදි මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා මෙම තත්වය වැළැක්විමට පියවර ගැනිමට තම එකගත්වය පළ කරන ලද අතර, එවැනි තත්වයක් ඇති නොවිමට වගබලා ගන්නා ලෙස දන්වන ලදි. |
| 03 | 2014.12.16 දිනැතිව **ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ** බස් රථ දේශපාලන රැළි සඳහා යොදා ගැනිම සම්බන්ධවයි යන හිසින් යුක්තව යොමු කරන ලද ලිපිය. | 2014.12.18 දින ගමනා ගමන මණ්ඩලයේ සභාපතිවරයා කොමිෂන් සභාව ඉදිරියට කැඳවා කරන ලද සාකච්ඡාවේදි මෙම කාරණය පිළිබඳව දිර්ඝ වශයෙන් සාකච්ඡා කළ අතර, එම තත්වය වැළැක්විමට පියවර ගැනිමට සභාපතිවරයා එකගත්වය පළ කරන |

| | | |
|---|---|---|
| | | ලදී. |
| 04 | 2014.12.23 දිනැතිව **ධීවර අමාත්‍යාංශය** විසින් සංවිධානය කරන ධීවර මහ සමුළුව සම්බන්ධව යන මැයෙන් ලිපියක් යොමු කර තිබුනි.<br><br>මෙම ලිපිය යොමු කර තිබුනේ 2014.12.23 දින නාරාහේන්පිට ශාලිකා ශාලාවේදි "ධීවර සම්මේලනයේ අරමුණ ප්‍රවර්ධනය කිරිම සහ ක්ෂේත්‍රයේ දස වසරක නවෝදය සමරන ජාතික මහා සමුළුව" පැවැත්වීමට නියමිත බවට දන්වමිනි. | මෙම ලිපිය යොමු වන විට අදාල සමුළුව පවත්වා ඇති බැවින් එම ලිපියේ කරුණු පිළිබඳව මූලික අයිතිවාසිකම් උල්ලංඝනයක් සම්බන්ධයෙන් ඉදිරි පියවර ගැනීම ප්‍රායෝගික නොවන බව නිගමනය විය. |
| 05 | 2014.12.31 දිනැති ලිපියක් මගින් **සමෘද්ධි නිලධාරින් හා සංවර්ධන නිලධාරින්** මැතිවරණ ප්‍රචාරන කටයුතු සඳහා යොදා ගැනිම පිළිබඳව කරුණු ඉදිරිපත් කර ඇත. | මේ පිළිබඳව 2015.01.05 දින වගඋත්තරකරුවන්ගෙන් වාර්තාවක් කැඳවිමට කටයුතු කර ඇති අතර පාර්ශවයන් කැඳවා විමර්ශනය කිරිමට කොමිෂන් සභාව තිරණය කර ඇත. |
| 06 | 2014.12.26 දිනැතිව කොමිෂන් සභාව වෙත දන්වා ඇත්තේ විශ්ව විද්‍යාල ආචාර්යවරුන් මගින් ඡන්දය ආයාචනය කිරිම සම්බන්ධව කරුණු දක්වා ඇත. | මෙම ලිපියේ අන්තර්ගත කරුණු පිළිබඳව කොමිෂන් සභාව විසින් සාකච්ජා කරන ලද අතර විශ්වවිද්‍යාල ආචාර්යවරුන් විද්වත් කණ්ඩායමක් වන බැවින් ඔවුන්ගේ දේශපාලන කටයුතු පිළිබඳව මැදිහත්විමක් අවශ්‍ය නොවන බවට දන්වන ලද බැවින් හා එය ආයතනික බලය යොදා ගෙන සිදු කරනු ලබන්නක් බවට කරුණු තහවුරු නොවීම නිසා වැඩිදුර මැදිහත් විමක් සිදු කර නොමැත. |
| 07 | 2014.12.24. දිනැතිව රාජ්‍ය | මේ සම්බන්ධව 2015.01.05 දින වගඋත්තරකරුවන් |

| | | |
|---|---|---|
| | නිලධාරීන් හා රාජ්‍ය දේපල මැතිවරණ කටයුතු සඳහා යොදා ගැනීම යන හිසින් යොමු කරන ලද ලිපිය.<br><br>මෙම ලිපිය මගින් කොමිෂන් සභාව වෙත දන්වා තිබුනේ **අනුරාධපුර දිස්ත්‍රික්කයේ එප්පාවල පොස්පේට් ලිමිටඩ් ආයතනයේ** සාමාන්‍යාධිකාරිවරයාගේ මෙහෙයවීම යටතේ සේවකයන් කිහිප දෙනෙකුගේ පත්වීම් මැතිවරණය ඉලක්කරගෙන ස්ථිර කිරීම කර ඇති බවත් අමාත්‍යාංශයේ වාහන මැතිවරණ ප්‍රචාරන කටයුතු වලට යොදා ගෙන ඇති බවත්ය. | කොමිෂන් සභාවේ සභාපතිතුමා ඉදිරියට කැඳවීම් කරන ලදි.<br>2015.01.02 දින ශ්‍රී ලංකා පොස්පේට් ආයතනයේ සභාපති ජාලිය පී.කුලසේකර මහතා ෆැක්ස් පණිවිඩයක් මගින් දන්වා තිබුනේ 2015.01.05 දින අත්‍යාවශ්‍ය රාජකාරි කිහිපයක් යොදා ගෙන ඇති බැවින් එදිනට පෙනී සිටිය නොහැකි බවත් වෙනත් දිනයක් ලබා දෙන ලෙසත්ය. ඒ අනුව මෙම කරුණු නැවත දිනයක කොමිෂන් සභාව ඉදිරියේ විමසීමට නියමිතය. |
| 08 | 2014.12.31 දිනැති ලිපියක් මගින් **මධ්‍යම සංස්කෘතික අරමුදලේ** සේවකයන් දේශපාලන රැස්වීම් සඳහා කැඳවීම් සම්බන්ධව කොමිෂන් සභාව වෙත කරුණු දන්වා තිබුනි. | මෙම ලිපියේ කරුණු පිළිබඳව අවධානය යොමු කළ කොමිෂන් සභාව 2015 ජනවාරි 02 වන දිනම දුරකථනය මගින් මධ්‍යම සංස්කෘතික අරමුදලේ සභාපතිවරයා සම්බන්ධ කර ගැනීමට ගත් උත්සහය ව්‍යාර්ත වුවද අනෙකුත් නිලධාරීන්ට මානව හිමකම් කොමිෂන් සභාවෙන් කථා කරන නිලධාරීන්ගේ නම් ප්‍රකාශ කොට එය නවතා දැමීමට ක්‍රියා කරන මෙන් මධ්‍යම සංස්කෘතික අරමුදලේ සභාපතිවරයාට දන්වන ලෙස දැනුම් දෙන ලදි.<br><br>කෙසේ වෙතත් 2015.01.01.05 වන දින පරීක්ෂණයක් පවත්වන ලද අතර මෙම සාකච්ඡාව සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය |

| | | |
|---|---|---|
| | | ගාමිණී අධිකාරි මහතා සඳහා නීතිඥ ආර්.එම්.එන්.බණ්ඩාර මහතා පෙනී සිටි අතර පැෆරල් ආයතනය වෙනුවෙන් නීතිඥ ජයන්ත දෙහිඅත්තගේ මහතා ද මැතිවරණ කොමසාරිස් වෙනුවෙන් සහකාර මැතිවරණ කොමසාරිස් ජේ. .ඒ.එස්.පී.ජයසිංහ මහතා පෙනී සිටින ලදී.<br><br>පැෆරල් සංවිධානය මගින් යොමු කර තිබූ ලිපියේ කරුණු දිර්ඝ වශයෙන් සාකච්ජාවට බඳුන් කරන ලදි. එහිදි මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කරන ලද සවිස්තරාත්මක පැහැදිලි කිරිම අනුව මෙම කාරණය සම්බන්ධයෙන් විමසිම අවසන් කිරිමට කොම්ෂන් සභාව තිරණය කරන ලද අතර පැෆරල් සංවිධානයට ද ඒ පිළිබඳව දන්වන ලදි. මෙහිදි මෙවැනි තත්වයන් ඇති නොවිමට වගබලා ගැනිම රාජ්‍ය ආයතන ප්‍රධානින් වගකිව යුතු බවද පෙන්වා දෙන ලදි. සභාපති එය පිළිගන්නා ලදි. |

## මැතිවරණ දිනයේ පැවති තත්ත්වය අධීක්ෂණය කිරීම

2015 ජනවාරි මස 08 වන දින මැතිවරණ දින තත්ත්වය අධීක්ෂණය කිරීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව තීරණය කරන ලදී. ඒ අනුව ඒ පිළිබඳ පූර්ව දැනුවත්කිරීමක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ අන්තර්ජාල පිටුව තුළ 2015.01.07 වන දින පළ කරන ලදී[5]. මෙම අධීක්ෂණ කටයුත්ත කොළඹ ප්‍රධාන කාර්යාලයට අමතරව දිප ව්‍යාප්තව ප්‍රාදේශීය කාර්යාල 10 හරහා ද සිදුකරන ලදී.

ඒ අනුව එදින පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයින්ගේ ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ප්‍රමාණවත් නිවාඩු ලබානොදීම පිළිබඳ ගැටලුවක් දුරකථන මගින් කොමිෂන් සභාව වෙත වාර්තා විය. ඒ අනුව ක්‍රියාත්මක වූ අධීක්ෂණ කණ්ඩායම කම්කරු දෙපාර්තමේන්තුව සමග සම්බන්ධ වීමෙන් එම ගැටලුව නිරාකරණය කිරීමට කටයුතු කරන ලදී.

ඡන්දය ප්‍රකාශ කිරීමට යන ඡන්ද දායකයින් වෙත එවකට බලයේ සිටි ශ්‍රී ලංකා නිදහස් සන්ධානයට සම්බන්ධ ආධාරකරුවන් බලපෑම් කරන බවට වාර්තා විය. ඒ අනුව උක්ත කරුණ සම්බන්ධයෙන් තොරතුරු වාර්තාවූ ප්‍රදේශවල තේරීම් භාර නිලධාරි කාර්යාලවල, මැතිවරණ නිරීක්ෂණ මධ්‍යස්ථාන සහ ප්‍රදේශයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාල වෙත ඒ සම්බන්ධයෙන් දැනුවත් කරන ලදී. ඇල්පිටිය වේයන්ගොඩ, වෙන්නප්පුව සහ පුස්ඇල්ලාව පිටිගල වැනි ප්‍රදේශ වලින් මේ පිළිබඳ කරුණු වාර්තා විය.

අනන්‍යතා ලේඛණවල ගැටලු පිළිබඳ පැමිණිලි ඉදිරිපත් වූ අතර ඡන්ද දායකයින්ට නිසි/ පිළිගත් අනන්‍යතා ලේඛණ පිළිගත් පරිදි ඉදිරිපත් නොකිරීම මෙම ගැටලුවට මූලික හේතු විය. තවද ඡන්දය සලකුනු කිරීමට යොදාගත් පෑන්/පැන්සල් පිළිබඳ නිල ඡන්ද පත්‍රිකා

[5] http://hrcsl.lk/english/?p=2503

වල නම් වැරදි ලෙස නිර්මාණය කිරීම වැනි පැමිණිලි ඉදිරිපත් විය. කුලී නිවැසියන් වෙත තමන් පදිංචි නිවාස වල අයිතිකරුවන් එම නිවාසවල ගෘහ අංක යොදා ඡන්ද ලියාපදිංචි වීම පිළිබඳ පැමිණිලි ද මේ අතර ඉදිරිපත් විය. එම කරුණු පිළිබඳ මැතිවරණයෙන් අනතුරුව විමසා බැලීම සිදුකළ යුතු ය.

මැතිවරණ අධීක්ෂණ කණ්ඩායම නිරන්තරයෙන්ම කොමිෂන් සභාවේ ප්‍රාදේශීය කාර්යාල සමග දුරකථන වෙතින් සම්බන්ධ වෙමින් එම ප්‍රදේශවල මැතිවරණය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ අවධානයෙන් කටයුතු කරන ලදී. සමස්ථයක් ලෙස මැතිවරණ දිනයේ ඡන්දය ප්‍රකාශ කළ කාලසීමාව තුළ ඉහළ මට්ටමේ ප්‍රචණ්ඩ ක්‍රියාවන් සිදුවන බවට කොමිෂන් සභාව වෙත වාර්තා වූයේ නැත.

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මේ සම්බන්ධයෙන් ඉදිරියේ දී අපේක්ෂිත මැදිහත්වීම්**

1. මැතිවරණ කාලයේ දී ලැබෙන පැමිණිලි වලට අදාලව එම කාලයේ ක්‍රියාත්මක වීම සිදුකිරීම මෙන්ම මැතිවරණයෙන් අනතුරුව ද උක්ත පැමිණිලි පිළිබඳව පැමිණිලි විභාගයන් සහ විමර්ශන කටයුතු දිගින් දිගටම සිදුකළ යුතු ය. ඡන්ද කාලයේ ලැබෙන පැමිණිලි ඡන්දයෙන් පසුව අවසන් වේ යන මහජන මතය වෙනස් කර ආයතන කෙරෙහි මේ මගින් විශ්වාසය ගොඩනගා ගත හැකි ය. ඒ අනුව රාජ්‍ය දේපල මැතිවරණ කටයුතු වලට යොදාගැනීමට අදාලව කරුණු ඉදිරිපත් වූ ලංකා ගමනාගමන මණ්ඩලය, රූපවාහිනී සංස්ථාව, ස්වාධීන රූපවාහිනිය, ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව, ලක්හඬ ගුවන්විදුලිය, දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව සහ එප්පාවල පොස්පේට් සමාගම වැනි ආයතන වලට එරෙහිව ලැබුණු පැමිණිලි සම්බන්ධව ( මෙම පැමිණිලි වලදී සමහර සේවාවන් මුදල් ගෙවීමේ පදනම මත සිදුවූ බව සඳහන් කරන ලදී. ලංකා ගමනාගමන, මණ්ඩලය රූපවාහිනී සංස්ථාව එම ආයතන අතර වේ) මැතිවරණයෙන් අනතුරුව ඉහත සඳහන් කළ කරුණු වල තත්වය අදාළ ආයතනවල පාලන අධිකාරියෙන් නැවත විමසා බැලීම සිදුකිරීම. එම කරුණු පිළිබඳව ගැටලු පවතී නම් එවකට අදාළ ආයතනවල අධිකාරීන් පුද්ගලිකව කැඳවීම සිදුකර සිදුව ඇති අක්‍රමිකතා වලට අදාලව පරීක්ෂණ පැවැත්වීම සහ එම කරුණු ප්‍රසිද්ධියට පත්කිරීම.

2. මැතිවරණ දිනයේ දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සියලු කාර්යාල දිනය පුරා විවෘතව තබා මැතිවරණයට අදාළ පැමිණිලි භාරගැනීම. (මැතිවරණය සති අන්තයක පැවැත්වීම සිදුකල ද)

3. මැතිවරණ වලට අදාළව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සිදුකරන කාර්යයන් සහ දායකත්වයන් පිළිබඳ දෛනික ප්‍රවෘත්ති නිවේදන නිකුත් කිරීම සිදුකළ යුතු ය. පසුගිය මැතිවරණ වලදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මැතිවරණ වල නිදහස් ස්වාධීන සහ අපක්ෂපාතී භාවය වෙනුවෙන් ගනු ලැබූ පියවර සමාජගත වීම ඉතාමත් අවම මට්ටමක පැවතීම නිසා කොමිෂන් සභාවේ දායකත්වය ඉස්මතු කරමින් ක්‍රියාත්මක වීමට මැතිවරණ ක්‍රියාවලියට අදාළ සෙසු පාර්ශවයන්ට පැවති ඉඩකඩ සීමා වූ බව පෙනේ.

4. මැතිවරණ නිරීක්ෂණ සංවිධාන සමග සබඳතා වඩාත් ශක්තිමත් කිරීම සහ ඔවුන් වෙතින් කොමිෂන් සභාව වෙත පැමිණිලි ලැබීමේ ක්‍රියාවලිය වඩාත් ශක්තිමත් කිරීම.

5. ඡන්දය භාවිතා කිරීමේදී ගැටලුකාරී තත්වයන්ට මුහුණ දෙන ආන්තික කණ්ඩායම් පිළිබඳ පර්යේෂණයක් සිදුකර ඔවුන්ගේ ඡන්දය භාවිතා කිරීම ශක්තිමත් කිරීම සම්බන්ධව ගත යුතු පියවරයන් මැතිවරණ කොමසාරිස්වරයා වෙත නිර්දේශ කිරීම.

6. පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයින් වෙත ඡන්දය භාවිතා කිරීමේදී පුද්ගලික නිවාඩු හෝ වැටුප් අහිමිවීමකින් තොරව කටයුතු කිරීමට අවශ්‍ය නීතිමය තත්වය ශක්තිමත් කිරීමට නව නීති හඳුන්වාදීමට කම්කරු අමාත්‍යාංශය වෙත නිර්දේශ නිකුත් කිරීම.

7. රාජ්‍ය මාධ්‍ය පවත්නා ආණ්ඩුවට පක්ෂග්‍රාහීව ක්‍රියාත්මක නොවීම සඳහා හා මාධ්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳව ශක්තිමත් වූත් ස්ථිරවූත් ක්‍රියාමාර්ග ගැනීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයාට බලය ලැබෙන ක්‍රමවේදයක් පිළිබඳ රජය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.

8. සෞඛ්‍ය කාර්ය මණ්ඩලවල සේවා අවශ්‍යතා නිසා නිවාඩු ලබාගැනීමට අපහසු කණ්ඩායම් වලට ඡන්දය භාවිතා කළහැකි වන ලෙස නීතිය වෙනස් කිරීමට නව නීති හඳුන්වාදීමට සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත නිර්දේශ නිකුත් කිරීම.

## මැතිවරණ දෙපාර්තමේන්තුව වෙත ලබාදෙන නිර්දේශයන්

1. ස්වාභාවික හෝ මානව මැදිහත්වීමෙන් සිදුවන ආපදා තත්වයන් වැනි කරුණු හේතු කොට ගෙන සිය වාසස්ථාන වලින් අවතැන් ව වෙනත් සුරක්ෂිත මධ්‍යස්ථාන වල ජනතාව එක්රුස්වී ඇති තත්වයන් පවතින විට අදාල තත්වයන් පිළිබඳ මැතිවරණ දෙපාර්තමේන්තුව දිස්ත්‍රික්ක මට්ටමේ සිය නිලධාරීන්ගෙන් තොරතුරු විමසා ආපදා තත්වය තුළ දී ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසා දිය යුතු ය.

2. අනන්‍යතා ලේඛණ වල ගැටලු ඇතිවීම වැළැක්වීම සඳහා මේවන විට සිදුකරන දැනුවත් කිරීම් වඩාත් පුලුල් කිරීම සිදුකළ යුතු ය.

3. කුලී නිවැසියන්ගේ ඡන්දය ලියාපදිංචි කිරීමේදී අදාල නිවසේ හිමිකරුවන් එම නිවසේ ගෘහ අංකය යොදා කුලී නිවාසියන් එම නිවසින් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂෙප කරන තත්වයක් වාර්තා වන බැවින් කුලී නිවාසියන්ගේ ඡන්දය ලියාපදිංචි කිරීමට ඇති අයිතිය හා එය තහවුරු වීම මගින් ඉදිරි මැතිවරණයේ දී ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාව තහවුරු කිරීමට සිදුසු පියවර ගත යුතු ය.

4. මැතිවරණ කොමසාරිස්වරයා සමග කරන ලද සම්බන්ධතා වඩාත් විධිමත් කිරීම සඳහා මැතිවරණ දෙපාර්තමේන්තුව තුළ මැතිවරණ කාලවකවනුවේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සමග කටයුතු කිරීම සම්බන්ධීකරණය කිරීමට නිලධාරියෙකු පත් කිරීම.

## සමාලෝචනය

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව දිවයින තුළ ජීවත්වන පුද්ගලයින්ගේ මූලික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට සහ මානව හිමිකම් ගරු කරන සංස්කෘතියක් ගරු කිරීමේ අරමුණින් සිදුකළ මැතිවරණ අධීක්ෂණ ක්‍රියාවලිය තුළ ශ්‍රී ලංකාවේ ජනතාව වෙත වඩාත් සාධනීය ප්‍රතිඵල ලැබෙන බව කිව යුතු ය. රාජ්‍ය ආයතන මැතිවරණ තුළ ක්‍රියාත්මක විය යුතු ආකාරය සහ පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන් වෙත සිය ඡන්දය සිට නිදහස්ව හා බලපෑමකින් තොරව භාවිතා කිරීමට ඉඩ සලසාදීම් වෙනුවෙන් සිදුකළ මැදිහත්වීම මෙහිදී කැපී පෙනෙයි.

රටක ප්‍රජාතන්ත්‍රවාදී වටපිටාව ශක්තිමත් කිරීම එම රටේ පුරවැසියන් අතර මානව ගරුත්වය හා මානව හිමිකම් සුරක්ෂිත කිරීම සඳහා මහගු දායකත්වයක් ලබාදිය යුතු බව කිව යුතු ය. ඒ අනුව තමන්ගේ පාලකයන් තමන්ගේ මතය අනුව පත්කිරීමට ඉඩ ලබාදීම එහිදී ප්‍රධාන වේ. නමුත් රාජ්‍ය මාධ්‍ය ආයතන වෙතින් යම් පාර්ශවයකට පක්ෂපාතී බවක් දක්වමින් සහ සෙසු කණ්ඩායම් වලට එරෙහිව ක්‍රියාත්මක වන්නේ නම් එය රටක නිදහස් මතයක් නිර්මාණය වීමට බාධාවකි. එවැනි තත්වයක් ශ්‍රී ලංකාව තුළ පසුගිය මැතිවරණයේ දී දකින්නට ලැබුණි. ඡන්දය තම අයිතියක් යන්න තේමා කර ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව දායකත්වය දක්වන ලද්දේ අවම මාධ්‍ය සහ භෞතික සම්පත් භාවිතයක් තුළ බව ද සඳහන් කළ යුතු වේ. අවසාන වශයෙන් මෙම කාර්ය සාර්ථක කර ගැනීමේ දී මැතිවරණ කොමසාරිස්වරයා ලබා දෙන ලද සහයෝගය සුවිශේෂී බව කිව යුතුය. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සිදු කළ දායකත්වය සහ මැදිහත් වීම ජනතාව වෙත ගලා යාම සහතික කිරීම සඳහා කොමසාරිස්වරයාගේ සුවිශේෂී දායකත්වය වඩාත් කැපී පෙනෙන බව කිව යුතුය. එමෙන්ම මැතිවරණ නිරීක්ෂණ සංවිධාන හා වෙනත් රාජ්‍ය නිලධාරීන් දැක්වූ දායකත්වයද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ඇගයීමට ලක්වේ.

මාධ්‍ය නිවේදන අංක 35

**ඌව පළාතේ පළාත් සභා ඡන්ද විමසීම - 2014.09.20**
**මැතිවරණ කොමසාරිස්ගේ නිවේදනය**

ඌව පළාතේ පළාත් සභාව වෙනුවෙන් මන්ත්‍රීවරුන් තෝරා පත්කර ගැනීම සඳහා වූ ඡන්ද විමසීම, බදුල්ල සහ මොණරාගල යන දිස්ත්‍රික්ක දෙකෙහි ඡන්ද දායකයින් 942,730 ක් උදෙසා ඡන්ද මධ්‍යස්ථාන 834 කදී 2014.09.20 දින පෙ.ව.7.00 සිට ප.ව. 4.00 දක්වා පවත්වන ලදී. පූර්ව ඡන්ද විමසීම් කාල පරිච්ඡේදයෙහි සමහර දේශපාලන පක්ෂවල ආධාරකරුවන් ප්‍රචණ්ඩකාරී ලෙස කටයුතු කරමින් ඡන්ද විමසීම් නීති මෙන්ම සාමාන්‍ය නීති උල්ලංඝනය කරමින් දේශපාලන කටයුතුවල යෙදීම පිළිබඳව ලද පැමිණිලි සංඛ්‍යාව හා එම කාලසීමාව තුළ සිදු වූ බවට පැමිණිලි ලද අනීතික ක්‍රියා පිළිබඳව සලකා බලන විට දී ඡන්ද විමසීම් දිනයෙහි පෝස්ටර්, බැනර්, කටවුට්වලින් තොරව සහ ඡන්ද මධ්‍යස්ථාන පරිශ්‍ර තුළ ගැටුම් ඇති වීමෙන් තොරව සාපේක්ෂ වශයෙන් සාමකාමී වාතාවරණයක් මධ්‍යයේ ඡන්ද විමසීම පවත්වන්නට හැකි වීම පිළිබඳ සතුටුවිය හැකිය. එසේ වුව ද බදුල්ල දිස්ත්‍රික්කයේ ස්ථාන කිහිපයක ඡන්ද විමසීමට සෘජු බලපෑමක් නොවන අයුරින් වුව ද ඡන්ද විමසීමේ දී සාහසික ක්‍රියා කිහිපයක් සිදු වීම පිළිබඳව මෙන්ම බදුල්ල දිස්ත්‍රික්කයෙහි ස්ථාන කිහිපයක හා මොණරාගල දිස්ත්‍රික්කයේ එයට වඩා අඩු ස්ථාන සංඛ්‍යාවක අපේක්ෂකයන් සමහරකු රථ පෙළපාලි සේ වාහන විශාල සංඛ්‍යාවක් රැගෙන ඡන්ද මධ්‍යස්ථාන කරා යෑම පිළිබඳව අපගේ කනස්සල්ල ප්‍රකාශ කර සිටිමු. එකී සිද්ධිවලට අදාළ කරුණු මෙම පළාත් සභා ඡන්ද විමසීම සම්බන්ධයෙන් පළ කරන අතුරු වාර්තාවේ හා 2012-2014 වර්ෂවල පවත්වන ලද සියලුම පළාත් සභා ඡන්ද විමසීම් සඳහා වූ පොදු වාර්තාවට ඇතුළත් කිරීමට යෝජිතය. මෙම සාහසික ක්‍රියාවලට වග කිවයුතු තැනැත්තන්ට එරෙහිව නීති මගින් ක්‍රියා කිරීමත්, මෙවැනි සිද්ධි ඇති වීම වැළැක්වීමට අවශ්‍ය සියලුම පූර්වෝපාය ගැනීමත්, ඡන්ද විමසීම් දිනයේ දී රථ පෙළපාලි පැවැත්වීම වැළැක්වීමට දැඩි පියවර ගැනීමත් අත්‍යාවශ්‍ය බව ද ප්‍රකාශ කර සිටිනු රිසියෙමි.මේ බව පොලිස්පතිවරයා වෙත දැන්වීමට අපේක්ෂා කරනු ලැබේ. කෙසේ වුවද බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්කවල ඡන්ද දායකයන්ට ඡන්ද පොළට පැමිණීමේ දී හා ස්වකීය ඡන්දය ඡන්ද පොළේ දී නිදහස්ව හා රහස්‍ය ලෙස භාවිතා කිරීමේ දී කිසිදු බාධාවක් වූ බවට පැමිණිලි නොලැබීම පිළිබඳව බෙහෙවින් සතුටු වෙමි.

ඡන්ද විමසීම සාර්ථකව අවසන් කිරීම සඳහා බදුල්ල සහ මොණරාගල දිස්ත්‍රික්ක දෙකෙහි දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් ද ඔවුන්ගේ කාර්ය මණ්ඩල සාමාජිකයින් හා ග්‍රාම නිලධාරීන් මෙන්ම මැතිවරණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයන්ද ඡන්ද විමසීමට අදාළව සම්බන්ධීකරණ හා මෙහෙයුම් කාර්යයන්හි නිරත වූ සියලුම රජයේ නිලධාරීන් සහ මැතිවරණ වෘත්තිකයින් විසින් ඉටුකළ සේවය අතිශයින් අගය කළ යුතුය. රාජ්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨතම නිලධාරීන්ගේ සිට අනියම් සහායකයන් දක්වා වූ සියලු නිලධාරීන් හා සේවකයන්ගේ සහාය නොමැති වූයේ නම් ඡන්ද විමසීමට අදාළ කාර්යයන් නිසි ලෙස ඉටු කර ගැනීමට නොහැකි වනු ඇත. රාජ්‍ය සේවයේ ගෞරවය හා කීර්තිය ආරක්ෂා කරමින් ඡන්ද විමසීම සාර්ථකව පැවැත්වීමට සහාය දුන් ඒ සියලුම දෙනා අපගේ ස්තුතියට හිමිකම් ලබති. නාමයෝජනා භාර ගැනීමේ දින බදුල්ල - මහියංගන පාරේ දී ඇති වූ අප්‍රසන්න සිදුවීම හේතුවෙන් කනස්සල්ලට පත්ව සිටීමින් වුවද, නොබියව මෙම ඡන්ද විමසීම් කාල සීමාව තුළ දී ඡන්ද විමසීම් නීති ආරක්ෂා කිරීම සඳහා විශේෂ උත්සාහයක් දැරූ මැතිවරණ දෙපාර්තමේන්තුවේ සියලුම නිලධරයන්ට හා එම කාර්යයට සහාය වූ සෙසු රජයේ නිලධාරීන්ට ද, රියදුරන් හා සහායකයන්ට ද මම අතිශයින්ම ස්තුතිවන්ත වෙමි. ඡන්ද විමසීමට අදාළ මූලික සංවිධාන කටයුතුවලට අමතරව ඡන්ද ප්‍රචාරක රැස්වීම් සඳහා ස්ථාන වෙන් කර ගැනීමේ ගැටලු, නීති විරෝධී ප්‍රචාරක කටයුතු පිළිබඳ ගැටලු, රජයේ නිලධාරීන් දේශපාලන කටයුතුවල නිරතවීම් පිළිබඳ පැමිණිලි යනාදී සියලු කරුණුවලදී නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා අවශ්‍ය යහපත් වාතාවරණය පවත්වා ගැනීම පිණිස මවිසින් දෙන ලද උපදෙස්වලට අනුකූලව ක්ෂණිකව මැදිහත් වෙමින් ඡන්ද විමසීම නිසිලෙස පැවැත්වීම සඳහා අමිල කාර්යයක් ඉටු කරනු ලැබූ බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්ක දෙකෙහි සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ගේ මෙන්ම ඔවුන්ගේ කාර්යය මණ්ඩල සාමාජිකයන්ගේ ද, ඔවුනට සහාය වූ මැතිවරණ දෙපාර්තමේන්තුවේ සෙසු නිලධාරීන්ගේ හා දෙපාර්තමේන්තුවට නිරතුරුව සහාය වන නිලධාරීන්ගේ සේවය අතිශයින් අගය කරමි. ඔවුනට අපගේ ස්තුතිය මෙන්ම ප්‍රශංසාව හිමි වේ.

ඡන්ද විමසීම් නීති තදින්ම ආරක්ෂා කිරීමට මැතිවරණ දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලැබුවේ කිසිදු දේශපාලන පක්ෂයක් හෝ කණ්ඩායමක් නැතහොත් අපේක්ෂකයකු ප්‍රවර්ධනය කිරීමට හෝ අගතියට පත් කිරීමට හෝ නොවන අතර, එය කිසිදු ආකාරයකින් ද්වේශ සහගත අරමුණකින් සිදු කරන ලද ක්‍රියාවක් නොවන බව

Z:\1 UVA Election-2014\7\35\34 (5).docx 1

වැඩිදුරටත් මෙහි සටහන් කරනු කැමැත්තෙමි. මැතිවරණ දෙපාර්තමේන්තුව ඡන්ද විමසීම් නීති උල්ලංඝනය කිරීම වැළැක්වීම සඳහා අවැසි සියලු කාර්යයන් ඉටුකිරීම් වස් හැකි උපරිම උත්සාහය දරන ලද්දේ, දිවයින තුළ ඡන්ද විමසීම් නීතිය ස්ථාපිත කිරීම යුගයේ අවශ්‍යතාවක් නිසා බව සටහන් කිරීම අත්‍යවශ්‍යය. එමෙන්ම ඉදිරියේදී ද ඒ අරමුණ වෙනුවෙන් මැතිවරණ දෙපාර්තමේන්තුව නොපැකිළව ක්‍රියා කරනු ඇති බව ද ප්‍රකාශ කරනු ලැබේ.

ඡන්ද විමසීමේදී වලංගු අනන්‍යතා ලියවිල්ලක් මගින් සිය අනන්‍යතාව සනාථ කළ යුතු යැයි යන නීතිමය තත්ත්වය නියම ආකාරයෙන් ආරක්ෂා කරමින් ජනතාවගේ ඡන්ද බලය සුරක්ෂිත කිරීම සඳහා ඡන්ද මධ්‍යස්ථාන නියමානුකූලව පවත්වාගෙන යමින්, අත්‍යාවශ්‍යම පෞද්ගලික පහසුකම් පවා අසීරුවෙන් සපයා ගැනීමට සිදුවූ දුෂ්කර ඡන්ද මධ්‍යස්ථානවලදී වුවද මැසිවිලි නැගීමකින් තොරව, සේවයේ යෙදෙමින් ස්වකීය රාජකාරි ඉටු කළ ඡන්ද ස්ථානාධිපතිවරුන් ඇතුළු ඡන්ද මධ්‍යස්ථානවල සේවය කළ සියලුම රාජ්‍ය නිලධාරීන්ගේ සේවය මුදලින් මැනිය නොහැකිය. ඔවුන්ගේ සේවය සියලුම ශ්‍රී ලාංකිකයන් විසින් අගයනු ඇතැයි හඟිමි. තවද අතිශයින් වෙහෙසකර ව්‍යායාමයක් වූ ඡන්ද විමසීමේ උච්චතම අවස්ථාව වන ඡන්ද හා මනාප ගණන් කිරීමේ කාර්යයේ නිරත වූ ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් ඇතුළු සියලුම නිලධාරීන්ට හා සහායකයන්ට අපගේ ස්තුතිය හිමි වේ. ඡන්ද විමසීමේ කාර්යය, ඡන්ද පෙට්ටි නිකුත් කිරීමේ හා භාර ගැනීමේ කාර්යය හා ඡන්ද ගණන් කිරීමේ කාර්යය යන ඡන්ද විමසීම් ක්‍රියාදාමය හා සෘජුවම බැඳී කාර්යයන්ට අමතරව සුභසාධන, ප්‍රවාහන, ශාලා පහසුකම්, පොදු පහසුකම්, තැපැල් ඡන්ද කටයුතු, කාර්ය මණ්ඩල පත් කිරීම් හා ප්‍රතිඵල වගුගත කිරීම යනාදි සෙසු කාර්යයන් භාරව ක්‍රියා කළ හා ඔවුනට සහාය වූ නිලධාරීන් වෙත පවරනු ලැබූ වගකීම් නිසි ලෙස ඉටු කිරීම මෙම ඡන්ද විමසීම සාර්ථකත්වයට හේතු වූ අද්‍යශ්‍යමාන කරුණු අතරට ගැනේ. ඒ සියලුම නිලධාරීන්ට අපේ කෘතඥතාව හිමි වේ.

අපේක්ෂකයින් අතුරින් කිහිප දෙනෙකු සහ ඔවුන්ගේ ආධාරකරුවන් විසින් සිදු කළ ප්‍රචණ්ඩකාරී මැර ක්‍රියාවන් සහ නීත්‍යානුකූල නොවන ඡන්ද ප්‍රචාරක කටයුතු පිළිබඳව බෙහෙවින් කණගාටු වන අතරම සාමකාමී හා නිතිගරුකව ඡන්ද ව්‍යාපාරයේ යෙදුණු සියලුම අපේක්ෂකයන් සහ එම අපේක්ෂකයන් මෙහෙයවනු ලැබූ සියලුම පක්ෂවල ලේකම්වරුන් හා දේශපාලන පක්ෂවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, ස්වාධීන කණ්ඩායම් නායකයින් සහ පැමිණිලි විමර්ශන කමිටුවේ දේශපාලන පක්ෂවල නිත්‍ය නියෝජිතයින් මෙම ඡන්ද විමසීම සාර්ථකව අවසන් කිරීම සඳහා දක්වන ලද සහයෝගය පිළිබඳව ද බෙහෙවින් ස්තුතිවන්ත වෙමි. නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් දරනු ලබන ප්‍රයත්නය සාර්ථක කර ගැනීමට එකී යහපත් දේශපාලනඥයන්ගේ සහාය අතිශයින් ප්‍රයෝජනවත් වේ.

පොලිස්පතිවරයා, මැතිවරණ විෂයභාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා, ඌව පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා සහ ඌව පළාතේ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් ඇතුළු මෙම ඡන්ද විමසීම සඳහා දායක වූ සියලුම පොලිස් නිලධාරීන් හා විශේෂ කාර්ය බලකායේ සාමාජිකයන් විසින් දක්වන ලද සහයෝගය බෙහෙවින් අගය කරන අතර ඒ සියලුම දෙනාට අතිශයින් කෘතඥ වෙමි. ඡන්ද විමසීම් දිනයේදී මෙන්ම එයට පෙර ද ක්‍රියාත්මක වූ ජාතික සම්බන්ධීකරණ මධ්‍යස්ථානය හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ මධ්‍යස්ථාන භාරව කටයුතු කළ සියලුම ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් හා එම නිලධාරීන්ට සහාය දැක්වූ පොලිස් නිලධාරීන් වෙතින් ඉටු වූ සේවය ද බෙහෙවින් අගය කොට සලකමි. ඡන්ද විමසීමට පෙර දින, ඡන්ද විමසීම් දින හා ඡන්ද ගණන් කිරීමේ දින ඡන්ද මධ්‍යස්ථානවල හා ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානවල ආරක්ෂාව සැපයීමේ දී වෙහෙස හා පහසුකම් පිළිබඳව තැකීමක් නොකර සේවයේ යෙදුණු සියලුම පොලිස් නිලධාරීන්ට හා විශේෂ කාර්ය බලකායේ නිලධාරීන්ට අපගේ විශේෂ ස්තුතිය හිමි වන බව මෙහි සටහන් කිරීම අපගේ යුතුකමකි. වගකීමකි. තවද අවශ්‍ය ඕනෑම විටක පොලිස් දෙපාර්තමේන්තුවට සහාය වීමට අපේක්ෂාවෙන් සූදානම්ව සිටි යුද හමුදාපතිවරයා ඇතුළු ත්‍රිවිධ හමුදා නිලධාරීන්ට ද අපගේ කෘතඥතාව හිමිවේ.

ඡන්ද විමසීම් පැවැත්වූ කාල සීමාව තුළ සෑම විටම මැතිවරණ නිරීක්ෂණ සංවිධාන විසින් ඡන්ද විමසීම් නීති උල්ලංඝනය වන අවස්ථා පිළිබඳව සොයා බලා වාර්තා කිරීමෙන්ද, අපේක්ෂකයන් හා දේශපාලන ක්‍රියාකාරීන් ඡන්ද විමසීම් නීතියට අනුගත කරවීමට උත්සාහ කිරීමෙන්ද දක්වන ලද සහයෝගය සහ උනන්දුව සම්බන්ධයෙන්ද අපගේ ස්තුතිය ඔවුන්ට හිමි වේ.පැමිණිලි හා වාර්තා ඉදිරිපත් කිරීමේ දී සනාථ කළ හැකි කරුණු සම්බන්ධයෙන් පමණක් තොරතුරු ප්‍රසිද්ධියට පත් කිරීමට ක්‍රියා කරන ලෙස අප විසින් කරනු ලැබ තිබූ ඉල්ලීමට අනුකූලතාව දැක්වීමට උත්සාහ කළ නිරීක්ෂණ සංවිධානවලට ඒ පිළිබඳව විශේෂ ස්තුතියක් හිමි වේ. නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා අපක්ෂපාතී නිරීක්ෂණ සංවිධානවල ක්‍රියාකාරීත්වය අත්‍යාවශ්‍ය වන හෙයින් මැතිවරණ දෙපාර්තමේන්තුව ඉදිරියේ දී ද නිරීක්ෂණ සංවිධානවල සහාය ඉතා ඕනෑකමින් අපේක්ෂා කරනු ලැබේ.

Z:\1 UVA Election-2014\7\35\34 (5).docx 2

සමස්ත ඡන්ද විමසීම් ක්‍රියාදාමය පුරාම රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිවරයා ඇතුළු සියලුම නිලධාරීන් සහ සහායකයන් ද නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා බෙදා හැරීම, තැපැල් ඡන්ද පිළිබඳව ක්‍රියා කිරීම හා හදිසි මැතිවරණ ලිපි බෙදා හැරීම යන කාර්යයන් නිසිලෙස ඉටු කරනු ලැබූ තැපැල් දෙපාර්තමේන්තුවේ තැපැල්පතිවරයා ඇතුළු සියලුම නිලධාරීන් සහ සහායකයන් ද, ඌව පළාතේ ඡන්දහිමියන්ට ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ කාර්යය කඩිනම් කරනු ලැබූ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයාට හා එහි කාර්ය මණ්ඩලයට ද, ලංකා විදුලිබල මණ්ඩලයේ, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නිලධාරීන් හා සහායකයන් විසින් දක්වන ලද සහයෝගය පිළිබඳව ද, මැතිවරණ කාර්ය මණ්ඩල ප්‍රවාහනය සඳහා පහසුකම් සලසා දුන් ශ්‍රී ලංකා දුම්රිය සේවයටත්, ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට හා කාර්ය මණ්ඩලයටත්, පෞද්ගලික බස් ප්‍රවාහකයන්ගේ සියලුම සංවිධානවලට හා එකී පෞද්ගලික බස් රථවල සේවයේ නිරත සැමටත්, කුලී පදනම මත සේවය සැපයූ පෞද්ගලික වාහන හිමියන්ට හා රියදුරන්ටත් මගේ ස්තූතිය පිරිනමමි. වලංගු හැඳුනුම්පතක් නොමැති වූ ඡන්ද දායකයින් වෙත විකල්ප පියවරක් වශයෙන් තාවකාලික හැඳුනුම්පත් ලබා දීමට කටයුතු කළ සියලුම ග්‍රාම නිලධාරීන් සහ වතු අධිකාරීවරුන් වෙතත් ඒ සඳහා සහාය වූ නිරීක්ෂණ සංවිධානවලටත් අපගේ ස්තූතිය හිමි වේ.

ඡන්ද විමසීම කටයුතු සඳහා හා ඡන්ද ගණන් කිරීමේ කටයුතු සඳහා රජයේ පාඨශාලා ලබා දීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයට හා ඌව පළාතේ පළාත් සභාවට ද එකී පාසල්වල අත්‍යවශ්‍ය පහසුකම් ලබා දීමට සහාය වූ පාසල් ප්‍රධානීන්ට ද ස්තූතිවන්ත වෙමි.

ඡන්ද විමසීම නීති බලාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙතින් ලද සහාය සම්බන්ධයෙන් එහි ගරු සභාපතිතුමා ඇතුළු කොමසාරිස්වරුන්ටත්, ලේකම්වරුන් ඇතුළු සමස්ත කාර්යය මණ්ඩලයටත් අතිශයින්ම කෘතඥ වෙමි. ඡන්ද විමසීමට අදාළ කාර්යයන් අධීක්ෂණ රාජකාරිවලට සහභාගී වී ආපසු පැමිණීමේ දී හදිසි අනතුරකට ලක්වීම නිසා එහි අධ්‍යක්ෂ (විමර්ශන) තනතුර දරමින් සිටි තුසිතා සමරසේකර මෙනවිය අභාවයට පත් වීම පිළිබඳව බලවත් කණගාටුව මෙයින් ප්‍රකාශ කර සිටිමි.

ප්‍රතිඵල ප්‍රකාශය ආරම්භයේ සිට ප්‍රතිඵල මාධ්‍යවලට මුදාහැරීමේ වගකීම භාරව කටයුතු කළ රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා, ප්‍රවෘත්ති අධ්‍යක්ෂවරයා ඇතුළු කාර්ය මණ්ඩලය සහ නාම යෝජනා දැන්වීම පළ කළ දින සිට මැතිවරණ දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී නිවැරදි තොරතුරු ලබා දීමට කටයුතු කළ මාධ්‍ය ආයතන සහ එම මාධ්‍ය ආයතන නියෝජනය කරනු ලබන මාධ්‍යවේදීන් දැක්වූ සහයෝගයද කෘතඥතා පූර්වකව සිහිපත් කරමි.

ඡන්ද විමසීමක් නිසි ලෙස පැවැත්වීම සඳහා අවශ්‍ය නීති රීති හා බලතල සියල්ලක්ම පැවතියද, නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්විය හැක්කේ දේශපාලන පක්ෂ නායකයන්ගේ, පක්ෂ ලේකම්වරුන්ගේ, දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම්වල අපේක්ෂකයන්ගේ, දේශපාලන ක්‍රියාකාරීන්ගේ සහ ඡන්ද දායකයන්ගේ සහාය ලදහොත් පමණකි. එබැවින් මෙම ඡන්ද විමසීමෙහි සාර්ථකත්වය සඳහා කිසියම් ගෞරවයක් හිමි විය යුතු නම් එහි වැඩි කොටසක් නීති ගරුකව ක්‍රියා කළ දේශපාලනඥයන්ට හා නොබියව නිදහස්ව ස්වකීය ඡන්දය පාවිච්චි කළ ඡන්ද දායකයන්ට හිමි වේ. ලියාපදිංචි ඡන්ද හිමියන්ගෙන් 75% කට අධික ප්‍රතිශතයක් ඡන්දය පාවිච්චි කර තිබීම ඕනෑම තත්ත්වයක් යටතේ ඉහළම ප්‍රතිශතයක් ලෙස සැලකිය හැකිය. එබැවින් ස්වකීය ඡන්ද අයිතිය භාවිතා කළ ඌව පළාතේ සියලුම ඡන්ද දායකයන්ට අපගේ ගෞරවය, ස්තූතිය හා ප්‍රණාමය මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

මැතිවරණ මහලේකම් කාර්යාලය,
සරණ මාවත,
රාජගිරිය.
2014.09.22

Z:\1 UVA Election-2014\7\35\34 (5).docx

3

ஊடக அறிவித்தல் - 35

## ஊவா மாகாணத்தின் மாகாண சபைத் தேர்தல் - 20.09.2014

ஊவா மாகாணத்தின் மாகாண சபைக்கான உறுப்பினர்களைத் தேர்ந்தெடுப்பதற்கான தேர்தல் பதுளை மற்றும் மொணராகலை ஆகிய இரண்டு மாவட்டங்களினதும் 942,730 வாக்காளர்களுக்காக 834 வாக்கெடுப்பு நிலையங்களில் 2014.09.20 ஆம் திகதி மு.ப 7.00 மணி முதல் பி.ப 4.00 மணி வரை நடாத்தப்பட்டது. தேர்தலுக்கு முன்னரான காலக்கெடுவிற்குள் சில அரசியற் கட்சிகளின் ஆதரவாளர்கள் வன்முறையில் ஈடுபட்டதோடு, தேர்தல் சட்டங்களையும், சாதாரண சட்டங்களையும் மீறிய வண்ணம் அரசியல் நடவடிக்கைகளில் ஈடுபட்டமை தொடர்பாகவும் கிடைக்கப்பெற்ற முறைப்பாடுகள் மற்றும் அக்காலக்கெடுவிற்குள் நிகழ்ந்ததாக முறைப்பாடு செய்யப்பட்ட சட்டமுரணான செயல்கள் தொடர்பாகவும் கருத்திலெடுக்கின்ற போது, தேர்தல் தினத்தன்று சுவரொட்டிகள், பதாகைகள், பாரிய அளவிலான உருவப்படங்கள் அற்றதும், வாக்கெடுப்பு நிலைய வளவிற்குள் வன்முறைகள் அற்றதுமான ஒப்பீட்டு ரீதியாகப் பார்க்கின்ற போது அமைதியான சூழ்நிலைக்கு மத்தியில் தேர்தலை நடாத்த முடிந்தமை பற்றி மகிழ்ச்சியடைய முடியும். எது எவ்வாறாயினும், பதுளை மாவட்டத்தின் பல்வேறு இடங்களில் தேர்தலை நேரடியாக பாதிக்காத போதிலும், வன்முறைச் செயற்பாடுகள் வாக்களிப்புத் தினத்தன்று நிகழ்ந்தமை தொடர்பாகவும் பதுளை மாவட்டத்தின் பல்வேறு இடங்களிலும், மொணராகலை மாவட்டத்தில் அதனிலும் பார்க்கக் குறைவான இடங்களிலும் வேட்பாளர்கள் சிலர் பெருந்தொகையான வாகனங்கள் சூழ வாகன ஊர்வலமாக வாக்களிப்பு நிலையங்களை நோக்கிச் சென்றமை தொடர்பாக எமது அதிப்ருதியை வெளிப்படுத்துகின்றோம். இந்நிகழ்வுகளோடு தொடர்புடைய விடயங்கள் இம்மாகாண சபைத் தேர்தல் தொடர்பாக வெளியிடப்படவுள்ள இடைக்கால அறிக்கையிலும், 2012 – 2014 ஆம் ஆண்டுகளில் நடாத்தப்பட்ட அனைத்து மாகாண சபைத் தேர்தலுக்குமான பொது அறிக்கையிலும் உட்சேர்க்கப்பட உத்தேசிக்கப்படவுள்ளது. இவ்வன்முறைச் செயல்களுக்கு பொறுப்புக்கூற வேண்டியவர்களுக்கெதிராக சட்ட நடவடிக்கையெடுத்தலும், இத்தகைய நிகழ்வுகள் நிகழ்ந்தமையைத் தவிர்ப்பதற்குத் தேவையான அனைத்து முன்நடவடிக்கைகளை எடுத்தலும், தேர்தல் தினத்தன்று வாகன ஊர்வலங்கள் நடாத்தப்படுவதைத் தவிர்ப்பதற்குக் கடும் நடவடிக்கையெடுத்தலும் மிக மிக இன்றியமையாததென தெரிவிக்க விரும்புகின்றேன். இது பற்றி பொலிஸ்மா அதிபருக்கு அறிவிக்க எண்ணியுள்ளேன். எவ்வாறாயினும் பதுளை மற்றும் மொணராகலை மாவட்டங்களில் வாக்காளர்கள் வாக்களிப்பு நிலையங்களுக்கு வருகை தருவதிலும் தத்தம் வாக்குகளை வாக்களிப்பு நிலையத்தில் சுதந்திரமாகவும், இரகசியமாகவும் பிரயோகிப்பதிலும் எவ்வித தடங்கலும் ஏற்பட்டதாக முறைப்பாடு கிடைக்கப்பெறாமை பற்றி பெரிதும் மகிழ்ச்சியடைகின்றேன்.

தேர்தலை வெற்றிகரமாக நிறைவு செய்து கொள்வதற்காக பதுளை மற்றும் மொணராகலை ஆகிய இரண்டு மாவட்டங்களினதும் மாவட்டத் தெரிவத்தாட்சி அலுவலர்களும், பிரதேச செயலாளர்களும் அவர்களின் பணியாட் குழு அங்கத்தினர்களும், கிராம அலுவலர்களும் போன்றே தேர்தல்கள் திணைக்களத்தின் தலைமை அலுவலகத்தினதும், மாவட்ட தேர்தல்கள் அலுவலகங்களினதும் அனைத்து பணியாட் குழு அங்கத்தினர்களும், தேர்தலோடு தொடர்புடைய இணைப்பு மற்றும் செயற்பாட்டுப் பணிகளில் ஈடுபட்ட அரசாங்க அலுவலர்கள் மற்றும் தேர்தல் தொழில் வல்லுனர்கள் ஆகியோர் ஆற்றிய சேவையை பெரிதும் மெச்சுதல் வேண்டும். அரசாங்க சேவையின் சிரேட்ட அலுவலர்களிலிருந்து அமய ஊழியர்கள் வரையிலான அனைத்து அலுவலர்களினதும், ஊழியர்களினதும் ஒத்துழைப்பு கிடைக்கப்பெறாவிடின், தேர்தலோடு தொடர்புடைய பணிகளை முறையாக ஆற்றிக் கொள்ள முடியாமற் போயிருக்கும். அரசாங்க சேவையின் கௌரவத்தையும், புகழையும் காப்பாற்றிய வண்ணம் தேர்தலை வெற்றிகரமாக நடாத்த ஒத்துழைப்பு நல்கிய அனைவருக்கும் எமது நன்றி உரித்தாகட்டும். வேட்புமனுத் தாக்கல் தினத்தன்று பதுளை - மஹியங்கனை வீதியில் நிகழ்ந்த விரும்பத்தகாத நிகழ்வு காரணமாக அதிருப்தி அடைந்திருந்த போதிலும், அச்சமின்றி இத்தேர்தல் காலக்கெடுவிற்குள் தேர்தல் சட்டங்களைப் பாதுகாப்பதற்காக விஷேட பிரத்தியேக முயற்சியெடுத்த தேர்தல்கள் திணைக்களத்தின் அனைத்து அலுவலர்களுக்கும் அதற்கு ஒத்துழைப்பு நல்கிய ஏனைய அரசாங்க உத்தியோகத்தர்கள், சாரதிகள், உதவியாளர்களுக்கும் எனது நன்றியறிதல் உரித்தாகட்டும். தேர்தலோடு தொடர்புடைய பூர்வாங்க ஒழுங்கமைப்பு நடவடிக்கைகளுக்கு மேலதிகமாக தேர்தல் பிரச்சாரக் கூட்டங்களுக்கான இடங்களை குறித்தொதுக்குதல் தொடர்பான பிரச்சினைகள், சட்ட முரணான பிரச்சார நடவடிக்கைகள் தொடர்பான பிரச்சினைகள், அரசாங்க உத்தியோகத்தர்கள் அரசியல் நடவடிக்கைகளில் ஈடுபடுகின்றமை தொடர்பான முறைப்பாடுகள் ஆகிய அனைத்து விடயங்களிலும் சுதந்திரமானதும் நீதியானதுமான தேர்தலொன்றை நடாத்துவதற்கு தேவையான சிறந்த சூழ்நிலையொன்றைப் பேணுவதற்கான எனது

அறிவுறுத்தல்களுக்கமைய உடனடியாகத் தலையிட்டு தேர்தலை முறையாக நடாத்துவதற்காக மகத்தான பங்களிப்பை நல்கிய பதுளை மற்றும் மொணராகலை ஆகிய இரண்டு மாவட்டங்களினதும் உதவித் தேர்தல்கள் ஆணையாளர்கள், அவர்களின் பணியாட் குழு அங்கத்தினர்கள், அவர்களுக்கு ஒத்துழைப்பு வழங்கிய தேர்தல்கள் திணைக்களத்தின் ஏனைய உத்தியோகத்தர்கள் மற்றும் திணைக்களத்திற்கு தொடர்ந்து ஒத்துழைப்பு வழங்கிக் கொண்டிருக்கின்ற அலுவலர்கள் ஆகியோரின் சேவையை பெரிதும் மெச்சுகின்றேன். அவர்களுக்கு எமது நன்றியறிதலும், புகழ்ச்சியும் உரித்தாகட்டும்.

தேர்தல் சட்டங்களை முறையாக நடைமுறைப்படுத்துவதற்கு தேர்தல் திணைக்களம் நடவடிக்கையெடுத்தமை எந்தவோர் அரசியற் கட்சியை அல்லது குழுவை அதுவுமின்றேல் வேட்பாளர் ஒருவரை ஊக்குவிக்கவோ, பாதிப்பேற்படுத்தவோ அல்லவென்பதோடு, அது எவ்விதத்திலும் துவேச மனப்பான்மை கொண்ட நோக்கத்தில் மேற்கொள்ளப்பட்ட ஒரு செயல் அல்லவெனவும் மேலும் குறிப்பிட விரும்புகின்றேன். தேர்தல்கள் திணைக்களம் தேர்தல் சட்ட மீறல்களைத் தவிர்ப்பதற்குத் தேவையான அனைத்து பணிகளையும், ஆற்ற முடிந்த அனைத்து முயற்சிகளையும் மேற்கொள்ளக் காரணம் நாட்டிற்குள் தேர்தல் சட்டத்தை நடைமுறைப்படுத்தல் காலத்தின் தேவையொன்றாக காணப்படுகின்றமையாலேயேயென ஈண்டு குறித்தல் அவசியமாகும். அதேபோன்று எதிர்காலத்திலும் இந்நோக்கங்களுக்காக தேர்தல்கள் திணைக்களம் அயராது முயற்சிக்குமெனவும் வெளிப்படுத்தப்படுகின்றது.

வாக்களிப்பின் போது செல்லுபடியான ஆளடையாள ஆவணமொன்றின் மூலம் தமது ஆளடையாளத்தை நிரூபித்தல் வேண்டுமென்ற சட்ட ஏற்பாட்டை முறையாகப் பேணி மக்களின் வாக்குரிமையைப் பாதுகாப்பதற்காக வாக்களிப்பு நிலையங்களை உரியவாறு நடாத்திச் சென்று, இன்றியமையாத தனிப்பட்ட வசதிகளைக் கூட சிரமத்துக்கு மத்தியில் பெற்று கொடுக்க வேண்டி வந்த பின்தங்கிய பிரதேசங்களின் வாக்குச் சாவடிகளில் கூடக் குறை கூறல்கள் இன்றி பணியில் ஈடுபட்டு தமது கடமையை ஆற்றிய தலைமை தாங்கும் அலுவலர்கள் உள்ளிட்ட வாக்கெடுப்பு நிலையங்களில் பணியாற்றிய அனைத்து அரசாங்க அலுவலர்களினதும் சேவையை பணத்தால் அளவிட முடியாது. அவர்களின் பணியை அனைத்து இலங்கையர்களும் மெச்சுவார்களென எண்ணுகின்றேன். மேலும் மிகவும் களைப்படையச் செய்யத்தக்க பணிகளில் ஒன்றான தேர்தலின் மிக முக்கியமான சந்தர்ப்பமொன்றாகக் கருதப்படுகின்ற வாக்குகளையும், விருப்புகளையும் எண்ணும் பணியில் ஈடுபட்ட தலைமை வாக்கெண்ணல் அலுவலர்கள் உள்ளிட்ட அனைத்து அலுவலர்களுக்கும் உதவியாளர்களுக்கும் எமது நன்றி உரித்தாகும். வாக்களிப்புப் பணிகள், வாக்குப் பெட்டிகளை விநியோகித்தல் மற்றும் கையேற்றல் பணிகள் ஆகிய வாக்களிப்பு, வாக்கெண்ணல் பணிகளோடு நேரடித் தொடர்புடைய செயற்பாடுகள் மற்றும் பணிகளுக்கு மேலதிகமாக நலன்புரி, போக்குவரத்து, மண்டப வசதிகள், பொது வசதிகள், அஞ்சல் வாக்கு நடவடிக்கைகள், பணியாட் குழுவினர்களின் நியமனங்கள் மற்றும் தேர்தல் முடிவுகளை அட்டவணைப்படுத்தல் ஆகிய பணிகளுக்கு பொறுப்பாகவிருந்து செயற்பட்டவர்களும், அவர்களுக்கு ஒத்துழைப்பு வழங்கிய அலுவலர்களும் தமக்குக் கையளிக்கப்பட்ட பொறுப்புகளை முறையாக ஆற்றியமை இத்தேர்தலின் வெற்றிக்குக் காரணமாக அமைந்த கட்புலனாகாத விடயங்கள் ஆகும். அவ்வுத்தியோகத்தர்கள் அனைவருக்கும் எமது நன்றி உரித்தாகும்.

வேட்பாளர்களில் பலரும் அவர்களின் ஆதரவாளர்களும் மேற்கொண்ட வன்முறைகள் மற்றும் சட்டவிரோத தேர்தல் பிரச்சார நடவடிக்கைகள் தொடர்பாக பெரிதும் வருந்துவதோடு, அமைதியாகவும் சட்டத்தை மதித்தும் தேர்தல் பிரச்சாரங்களிலீடுபட்ட அனைத்து வேட்பாளர்கள், அவ்வேட்பாளர்களை வழி நடாத்திய அனைத்து கட்சிகளினதும் செயலாளர்கள், அரசியல் கட்சிகளின் சிரேட்ட உத்தியோகத்தர்கள், சுயேச்சைக் குழுத் தலைவர்கள் மற்றும் முறைப்பாட்டு விசாரணைக் குழுவின் அரசியற் கட்சி நிரந்தர முகவர்கள் ஆகியோர் இத்தேர்தலை வெற்றிகரமாக நடாத்தி முடிக்க வழங்கிய ஒத்துழைப்புத் தொடர்பாகவும் பெரிதும் நன்றியுடையவனாவேன். சுதந்திரமானதும், நீதியானதுமான தேர்தலொன்றை நடாத்துவதற்காக தேர்தல்கள் திணைக்களத்தினால் எடுக்கப்படுகின்ற முயற்சியை சாத்தியப்படுத்திக் கொள்ள அத்தகைய சிறந்த அரசியல்வாதிகளின் ஒத்துழைப்பு பெரிதும் பயனுடையதாகும்.

பொலிஸ்மா அதிபர், தேர்தல் விடயத்துக்குப் பொறுப்பான சிரேட்ட பிரதிப் பொலிஸ்மா அதிபர், ஊவா மாகாணத்துக்குப் பொறுப்பான சிரேட்ட பிரதிப் பொலிஸ்மா அதிபர் மற்றும் ஊவா மாகாணத்தின் சிரேட்ட பொலிஸ் அலுவலர்கள் உள்ளிட்ட இத்தேர்தலில் பங்களிப்பு வழங்கிய அனைத்து பொலிஸ் அலுவலர்கள் மற்றும் விஷேட அதிரடிப்படை அங்கத்தவர்கள் ஆகியோரினால் வழங்கப்பட்ட ஒத்துழைப்பை பெரிதும் மதிப்பதோடு, அவ்வனைவருக்கும் பெரிதும் நன்றியுடையவனாவேன். தேர்தல்

2

தினத்தன்றும் அதற்கு முன்னரும் தொழிற்பட்ட தேசிய இணைப்பு நிலையம் மற்றும் பிரதேச இணைப்பு நிலையங்களுக்கு பொறுப்பாகவிருந்து பணியாற்றிய அனைத்து சிரேட்ட பொலிஸ் அலுவலர்கள், அவர்களுக்கு ஒத்துழைப்பு வழங்கிய பொலிஸ் அலுவலர்கள் ஆகியோரினால் ஆற்றப்பட்ட பணியையும் பெரிதும் மதிக்கின்றேன். தேர்தல் தினத்திற்கு முந்திய தினம், தேர்தல் தினம் மற்றும் வாக்கெண்ணல் தினம் ஆகிய நாட்களில் வாக்கெடுப்பு நிலையங்களிலும், வாக்கெண்ணல் நிலையங்களிலும் பாதுகாப்பு வழங்குவதற்காக களைப்பையும், வசதிகளையும் பொருட்படுத்தாமல் பணியிலீடுபட்ட அனைத்து பொலிஸ் அலுவலர்களுக்கும் விஷேட அதிரடிப்படை உத்தியோகத்தர்களுக்கும் எமது தனிப்பட்ட நன்றி உரித்தாக வேண்டுமென இங்கு குறித்தல் எமது கடமையும் பொறுப்புமாகும். மேலும் தேவையான எச்சந்தர்ப்பதிலும் பொலிஸ் திணைக்களத்திற்கு உதவும் நோக்கோடு தயார் நிலையிலிருந்த இராணுவத் தளபதி உள்ளிட்ட இராணுவ அலுவலர்களுக்கும் எமது நன்றி உரித்தாகும்.

தேர்தல் நடாத்தப்பட்ட காலக்கெடுவிற்குள் எப்பொழுதும் தேர்தல் கண்காணிப்பு குழுக்களினால் தேர்தல் சட்டமீறல் சந்தர்ப்பங்கள் தொடர்பாகக் கண்டறிந்து, அறிக்கை சமர்ப்பித்தலூடாகவும், வேட்பாளர்கள் மற்றும் அரசியல் தொழிற்பாட்டாளர்கள் ஆகியோரை தேர்தல் சட்டங்களுக்கு அமைவான விதத்தில் நடந்து கொள்ளச் செய்வதற்கு முயற்சியெடுத்தலூடாகவும் காட்டிய ஒத்துழைப்புக்கும், ஆர்வத்திற்கும் எமது நன்றி உரித்தாகும். முறைப்பாடுகள் மற்றும் அறிக்கைகளை சமர்ப்பிக்கின்ற போது நிருபிக்க முடிந்த விடயங்கள் தொடர்பாக மாத்திரம் தகவல்களை பகிரங்கப்படுத்த நடவடிக்கையெடுக்குமாறு எம்மால் முன்வைக்கப்பட்ட கோரிக்கைகளுக்கு இணக்கப்பாடு காட்ட முயற்சியெடுத்த கண்காணிப்புக் குழுக்களுக்கும் இது தொடர்பான விஷேட நன்றி உரித்தாகும். சுதந்திரமானதும், நீதியானதுமான தேர்தலொன்றை நடாத்துவதற்காக கட்சி சார்பற்ற கண்காணிப்பு அமைப்புக்களின் செயற்பாடு மிக இன்றியமையாததால், தேர்தல் திணைக்களம் எதிர்காலத்திலும் கண்காணிப்பு அமைப்புக்களின் ஒத்துழைப்பை மிக ஆவலோடு எதிர்பார்க்கின்றது.

தேர்தல் செயன்முறை பூராவும் அரசாங்க அச்சக திணைக்களத்தின் அழுத்தகர் உள்ளிட்ட அனைத்து உத்தியோகத்தர்களும், உதவியாளர்களும், உத்தியோகபூர்வ வாக்காளர் அட்டைகளின் விநியோகம் அஞ்சல் வாக்குகள் தொடர்பாக நடவடிக்கையெடுத்தல் மற்றும் துரித தேர்தல் கடிதங்களைப் பகிர்ந்தளித்தல் ஆகிய பணிகளை முறையாக ஆற்றிய அஞ்சல் திணைக்களத்தின் அஞ்சல்மா அதிபர் உள்ளிட்ட அனைத்து அலுவலர்களும், உதவியாளர்களும் ஊவா மாகாணத்தின் வாக்காளர்களுக்கு தேசிய அடையாள அட்டைகளை விநியோகிக்கும் பணிகளைத் துரிதப்படுத்திய ஆட்களைத் பதிவு செய்யும் திணைக்களத்தின் ஆணையாளர் நாயகம் உள்ளிட்ட அதன் பணியாட் குழுவினர்கள், இலங்கை மின்சார சபையின், ஸ்ரீலங்கா ரெலிகொம் நிறுவனத்தின், தேசிய நீர்வழங்கல், வடிகால் அமைப்புச் சபையின் அலுவலர்கள், உதவியாளர்கள் ஆகியோர் காட்டிய ஒத்துழைப்புத் தொடர்பாகவும், தேர்தல் பணியாட் குழுவினர்களின் போக்குவரத்துக்காக வசதியேற்படுத்தித் தந்த இலங்கை புகையிரத சேவைக்கும், இலங்கை போக்குவரத்து சபைக்கும், அவற்றின் பணியாட் குழுவினருக்கும், தனியார் போக்குவரத்தாளர்களின் அனைத்து அமைப்புக்களுக்கும், அத்தகைய தனிப்பட்ட பஸ் வண்டிகளில் சேவையிலீடுபட்ட அனைவருக்கும், வாடகை அடிப்படையில் சேவையாற்றிய தனியார் வாகன உரிமையாளர்களுக்கும், சாரதிகளுக்கும் எனது நன்றியறிதலைத் தெரிவித்துக் கொள்கின்றேன். செல்லுபடியான அடையாள அட்டையொன்று காணப்படாத வாக்காளர்களுக்கு மாற்று தீர்வொன்றென்ற வகையில் தற்காலிக அடையாள அட்டைகளை வழங்குவதற்கு நடவடிக்கையெடுத்த அனைத்து கிராம அலுவலர்கள், தோட்ட அத்தியட்சகர்கள் ஆகியோருக்கும் அதற்காக ஒத்துழைப்பு வழங்கிய கண்காணிப்பு அமைப்புக்களுக்கும் எமது நன்றி உரித்தாகட்டும்.

வாக்களிப்பு நடவடிக்கைகளுக்காகவும், வாக்கெண்ணல் நடவடிக்கைகளுக்காகவும் அரசாங்கப் பாடசாலைகளை வழங்கியமைக்காக கல்வி அமைச்சுக்கும், ஊவா மாகாணத்தின் மாகாண சபைக்கும் அப்பாடசாலைகளில் அத்தியவசிய வசதிகளை வழங்குவதற்கு ஒத்துழைப்பு வழங்கிய பாடசாலை அதிபர்களுக்கும் நன்றி தெரிவிக்கின்றேன்.

தேர்தல் சட்டங்களை அமுலாக்கம் செய்வதற்காக இலங்கை மனித உரிமை ஆணைக்குழுவினால் வழங்கப்பட்ட ஒத்துழைப்புத் தொடர்பாக அதன் கௌரவ தவிசாளர் உள்ளிட்ட ஆணையாளர்களுக்கும், செயலாளர்கள் உள்ளிட்ட மொத்தப் பணியாட் குழுவினர்களுக்கும் பெரிதும் நன்றியுடையவனாவேன். தேர்தலோடு தொடர்புடைய பணிகளின் மேற்பார்வைக் கடமைளிலீடுபட்டு மீண்டு வருகையில் திடீர் விபத்துக்குள்ளாகியமை காரணமாக அதன் பணிப்பாளர் (விசாரணை) பதவியை வகித்த செல்வி. துசித்தா சமரசேகர மரணமடைந்தமை தொடர்பாக மிகுந்த கவலையை இத்தால் தெரிவித்துக் கொள்கின்றேன்.

3

ஆரம்பம் முதல் தேர்தல் முடிவுகளை ஊடகங்களுக்கு விடுவிக்கும் பொறுப்பை வகித்த அரசாங்க செய்திப் பணிப்பாளர் நாயகம், செய்திப் பணிப்பாளர் உள்ளிட்ட பணியாட் குழுவினர், வேட்புமனு அறிவித்தல் பிரசுரிக்கப்பட்ட திகதியிலிருந்து தேர்தல்கள் திணைக்களத்தோடு தொடர்பு கொண்டு சரியான தகவல்களை வழங்குவதற்கு நடவடிக்கையெடுத்த ஊடக நிறுவனங்கள் மற்றும் அவ்வூடக நிறுவனங்களைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற ஊடகவியலாளர்கள் ஆகியோர் காட்டிய ஒத்துழைப்பையும் நன்றியுணர்வோடு நினைவு கூருகின்றேன்.

தேர்தலொன்றை முறையாக நடாத்துவதற்குத் தேவையான சட்ட விதிகள், தத்துவங்கள் அனைத்தும் இருந்த போதிலும் சுதந்திரமானதும், நீதியானதுமான தேர்தலொன்றை நடாத்த முடிவது, அரசியற் கட்சித் தலைவர்களினதும், செயலாளர்களினதும் அரசியற் கட்சிகள் மற்றும் சுயேச்சைக் குழுக்களின் வேட்பாளர்களினதும், அரசியல் செயற்பாட்டாளர்களினதும், வாக்காளர்களினதும் ஒத்துழைப்புக் கிடைத்தால் மாத்திரமேயாகும். ஆதலால், இத்தேர்தலின் வெற்றிக்காக ஏதேனும் ஒரு கௌரவம் உரித்தாக வேண்டியிருப்பின், அதன் பெரும் பகுதி சட்டத்தை மதித்து நடந்த அரசியல்வாதிகளுக்கும், அச்சமின்றியும், சுதந்திரமாகவும் தமது வாக்குகளை அளித்த வாக்காளர்களுக்குமே உரித்தாகும். பதிவு செய்யப்பட்ட வாக்காளர்களில் 75% ற்கும் அதிகமான சதவீதத்தினர் வாக்கினைப் பிரயோகித்திருந்தமை எந்தவொரு நிலைமையின் கீழும் உயர்ந்த சதவீதமொன்றாகக் கருத முடியும். ஆதலால், தமது வாக்குரிமையைப் பயன்படுத்திய ஊவா மாகாணத்தின் அனைத்து வாக்காளர்களுக்கும் எமது கௌரவமும் நன்றியும் இத்தால் வெளிப்படுத்தப்படுகின்றது.

மஹிந்த தேசப்பிரிய,
தேர்தல்கள் ஆணையாளர்.

தேர்தல்கள் செயலகம்,
சரண மாவத்தை,
இராஜகிரிய,
22.09.2014

4

**MEDIA RELEASE NO: 35**

**UVA PROVINCE PROVINCIAL COUNCIL ELECTIONS - 20.09.2014**

**MESSAGE FROM THE COMMISSIONER OF ELECTIONS**

